# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2019.08.20

වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 20 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ අගෝස්තු මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
16. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
17. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
18. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
19. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
20. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
21. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
22. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභා ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

(ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා, ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා, ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය.)

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

**1) 2019.07.23 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019.07.23 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2019.07.23 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** 2019.07.23 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේනම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි,

14 පිටුව

"ගරු සභාපතිතුමා මටත් තියෙනවා ඒ සම්බන්ධව යමක් කියන්න. තේ පැන් සංග්‍රහය වේලාවේදී සීනි දාලා තේ නොබොන මන්ත්‍රීවරු කීපදෙනෙක් ඉන්නවා. ඒ නිසා ඒ මන්ත්‍රීවරුන්ගේ තේ එක රිටන් කරනවා. ඒ මන්ත්‍රීවරුන්ට ආයේ තේ එකක් ලැබෙන්නේ නෑ. ඊළඟ සභාවාරයේදී ඉඳගෙන ඒ මන්ත්‍රීවරු ගැන දැනුවත් වෙලා සීනි නොදා ඒ මන්ත්‍රීවරුන්ට තේ සපයන්න කියලා ඉල්ලා සිටිනවා."

ඒ ජේදය සම්පූර්ණයෙන්ම මම කරන ලද ප්‍රකාශයක් නෙමෙයි. ඒක සංශෝධනය විය යුතුයි. මෙහෙම රෝගීන් ඉන්න බව කාර්ය මණ්ඩලය දන්නේ නැතුව ඇති. මම රෝගියෙක් කියලා බෝඩ් එකක් ගහ ගන්නවා නම් හරි මට අසවල් රෝගය තියෙනවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගයාත්‍රි කාංචනා මන්ත්‍රීතුමිය කරපු ප්‍රකාශයක්. ඒක සංශෝධනය කරන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාටම සුභ උදෑසනක්

07 පිටුව

"මෙහෙමයි සභාපතිතුමා අපේ පක්ෂයේ මගේ සහෝදර මන්ත්‍රීතුමා කියපු නිසා කියන්න ඕන. මම ඒ වෙලාවේ සහභාගි වෙලා හිටියා."

හැබැයි මෙතුමා කියපු වචන එතනදී පාවිච්චි වුනේ නෑ කියලා මම කිව්වා. මෙතන තියෙන්නේ මෙතුමා කියපු ප්‍රකාශ මම සහතික කරනවා වගේ ප්‍රකාශයක්.

එහෙම දෙයක් වුනේ නෑ. මෙතන තියෙන විදියට මෙතුමා කියපු දේ මම සහතික කරා වගේ අර්ථයක් යනවා. මෙතුමා කියපු දේ හරි කියලා අර්ථයක් යනවා. මම තමයි මුලින්ම එහෙම කිව්වේ අපේ මන්ත්‍රීතුමා එහෙම ප්‍රකාශයක් කරාට. රෙකෝඩින් එක බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක සංශෝධනය කරන්නම්.

2019.07.23 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ඉහත සංශෝධන ඇතුළත්ව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාව මුදල් පිළිබඳව බරපතල ගැටලුවක ඉන්නේ. ඒක සියලු මන්ත්‍රීවරු දැන ගන්න ඕන. අපි දැනට වරිපනම් බදු මුදල්, මුද්දර ගාස්තු වලින් තමයි සභාවේ වැඩ කටයුතු කරගෙන යන්නේ. ඒකෙදි වරිපනම් බදු මුදල් අයවීම ඒ තරම් හොඳ මට්ටමක නෑ. ජංගම සේවාවල් තුනක් අපි පැවැත්වූවා කොට්ඨාශ තුනක. ඒකේදිත් පසුගිය කාලයේදී තරම් ප්‍රගතියක් දකින්න ලැබුණේ නෑ. ඒක තුළ සභාවේ වැඩ කටයුතු පවත්වා ගෙන යන්න විශාල ශක්තියක්, ශ්‍රමයක් ලේකම්තුමා දරනවා. ඒකෙදි අපිට හැකි උපරිම ආකාරයෙන් ආදායම් වැඩි කර ගන්න කටයුතු කිරීම සියලු මන්ත්‍රීතුමන්ලාගේ, මන්ත්‍රීතුමියන්ලාගේ වගකීමක්. වරිපනම් ගෙවන්න කියලා තමන්ගේ කොට්ඨාශ වල ජනතාව පොළඹවන්න කියලා මම මේ අවස්ථාවේදී කියන්න ඕන.

ඒ වගේම කලේගාන පොළ භූමියේ ගොඩනැගිල්ල ඉදිකිරීම පිළිබඳව අපි සැලැස්ම සකස් කරලා තියෙන්නේ. ඒකේදී අපි ණය මුදලක් හෝ ලබාගෙන ගොඩනැගිල්ලේ වැඩ කටයුතු ආරම්භ කරන්න ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා.

ආදාහනාගාරය සෑදීමේ කටයුත්තයි, ඒ කටයුත්තයි ප්‍රමුඛ කාර්යයන් සේ සලකලා කරන්න බලාපොරොත්තු වෙනවා. ඒකට සියලු දෙනාගේම අවශ්‍ය සහයෝගය ලබා දෙන්න.

ඒ එක්කම තියෙනවා දිවා කාලයේ වීදි පහන් දල්වා තැබීම සම්බන්ධයෙන් විදුලි බල මණ්ඩලය එවපු ලිපියක්. ඒක පාලනය කරන්න කියලා තමයි ඉල්ලන්නේ. අපිත් දකිනවා පාරේ යනකොට දවල් කාලයේදී ඊට කලින් දවසේ හවස දාපු වීදි පහන් පත්තු වෙනවා. මම දැනුම් දීලා තියෙන්නේ ඒ වීදි පහන් එම ස්ථාන වලින් ගලවාගෙන එන්න කියලා. මන්ත්‍රීවරුන් ඇවිත් චෝදනා කරන්න එපා අතන තිබුණ වීදි පහන් කට්ටලය ගලවා ගෙන ආවා කියලා. එවපු ලියුමත් ලබා දීලා ඇති. ඊට කලිනුත් මම දැනුවත් කිරීම් කරලා ඇති. වීදි පහන් දවල් වරුවෙත් පත්තු වෙනවානම් පළවෙනි පාර, දෙවැනි පාර කියලා ඊට පස්සේ ඒ වීදි පහන් කට්ටලය එතනින් ඉවත් කරන්න කියලා.

( ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා, ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා, අපි මේ ගැන ඊට ඉස්සෙල්ලා අදහස් දැක්වූවා. ඉතාම පැහැදිලිව මේක ගිය සභාවල් වලත් ගෙනාවා. මේ සභාවල් වලත් ගෙනාවා. මේක හරියටම කරේ බද්දේගම ලැන්රෝල් සභාපතිතුමා. ඉඩි අමීන් වගේ හිටියට කියන්න ඕන කරපු හොඳ. මොකද හේතුව මුලින්ම ගලවා ගෙන ආවේ වෙන කාගේවත් නෙමෙයි තමන්ගේ සහෝදරයා වන අබේවික්‍රම මහත්තයාගේ ගෙවල් ගාව වීදි පහන් කට්ටලය. ඒක නිවන්නේ නෑ. මිනිස්සුන්ගේ අවශ්‍යතාවයන් වලට වීදි පහන් දාලා තියෙනවානම් ඒක කිරීමේ වගකීමකුත් තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් අපි සභාවේ මුල ඉඳන්ම මතු කරා පොදු ප්‍රතිපත්තියකට යන්න ඕන කියලා යෝජනාවක් කරලා. වීදි පහන් සවිකරලා තියෙන්නේ පෞද්ගලිකව එක එක්කෙනාගේ වුවමනාවන්, එපාකම් නිසා මිසක් ප්‍රතිපත්තිමය අවශ්‍යතාවයන් බලලා නියමයකට අනුව නෙමෙයි. ඒ නිසාම තමයි අපිට මේ ප්‍රතිවිපාකය තියෙන්නේ. හුඟක් වෙලාවට කාගේ හරි ඉල්ලීමකට මේ වීදි පහන් සවි කරලා එනවා. පෞද්ගලික ඉල්ලීම් වලට නෙමෙයි කියන්න බෑ. මේක ගැන සභාවම දන්නවා නේ. මේක ගැන තර්ක කරන්න දෙයක් නෑ. පෞද්ගලික ඉල්ලීම් වලට, තම තමන්ගේ පාරවල් අඳුරුයි කියලා මිනිස්සු කරන ඉල්ලීම් වලට තමයි ලබා දීලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම දීපු කීපයකුත් තියෙනවා. නමුත් පොදුවේ මහජනතාවගේ ආරක්ෂාව සඳහා සවි කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ පැහැදිලි කිරීම තමයි මම මේ කරේ. අපි මුලින් කිව්වා මේකට මොකක් හරි ප්‍රතිපත්තියක් හදන්න කියලා. මේ වීදි පහන් සඳහා ප්‍රතිපත්තියක් හැදුවා නම්, හැමතැනම දල්වන්න දාන්න අවශ්‍ය නෑ. අවිධිමත් ලෙස කරන්නේ නෑ. අවිධිමත්භාවය නිසා තමයි මේ ගැටළුව තියෙන්නේ. සමහර තැන්වල ස්වීච් එක ඔන් කරන්න පුළුවන් තැනක නෙමෙයි සවිකරලා තියෙන්නේ. කණුවේ සවි කරලා තියෙන්නේ. කණුව තියෙන්නේ ඇතුළක.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අවශ්‍යතාවය අනුව සවිකරලා තියෙන්නේ. අවශ්‍යතාවයට ස්විච් එක සවිකරන තැන නෙමෙයි වැදගත් වෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔහොම ඉන්නකෝ පොඩ්ඩක්. ඒක තමයි පැහැදිලි කරන්නේ. අවශ්‍යතාවය තියෙන තැනට වුනත් කාටහරි පහසුවෙන් නිවන්න, දල්වන්න විදියක් තියෙන්න ඕන. සමහර තැන්වල ස්වීච් එක සවිකරාට පස්සේ එතන වල් වැදිලා. අඩියක්වත් තියන්න පුළුවන් තැනක නෙමෙයි තියෙන්නේ. ඒ වැඩේ ප්‍රායෝගික අපහසුතාවල් තියෙනවා. ඒ නිසා මිනිස්සු එතනට ගිහින් ස්වීච් එක නිවන්න යන්නේ නෑ. ඒ වගේ ප්‍රශ්න තියෙනවා. ඒ නිසා තමයි අපි කිව්වේ. ඒ වගකීම තියෙන්නේ අපේ සභාවට. ඒ වගේම තමයි මේකේ විදුලි බිල ගෙවන්නේ මේ රටේ ජනතාව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මන්ත්‍රීතුමා මෙහෙම දෙයක් තියෙනවා. 99.99% ක්ම වීදි පහන් නිවනවා. බොහොම කලාතුරකින් එකක් දෙකක් තමයි තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි දැකලා තියෙනවා ඒ මිනිස්සුන්ට සවි කරගන්න තියෙන වුවමනාව නෑ මේක නිවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හරි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ සමහර ඉල්ලීම් කරන්නේ බැරිකමටම නෙමෙයි. මේක අමතක කරලා ඉන්නවා, මොකද තමුන්ගේ විදුලි බිලට එකතු වෙන්නේ නෑ නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 99.99% ක් කිවුවේ මේකයි මන්ත්‍රීතුමා. වීදි පහන් කට්ටල 15,000 ක් විතර දාලා තියෙනවා. එයින් වීදි පහන් 50 ක් විතර වගේ තමයි මේ ප්‍රශ්නය තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සමහර වීදි පහන් ආසන්නයේ ගෙවල් නෑ. සවි කල යුතුයි ඒ වගේ සමහර තැන්වල. ඒකට ක්‍රමවේදයක් තියෙන්න ඕන. ඒ අසල නිවැසියන් දැනුවත් කරන්න ඕන මේක හවසට දාලා උදේට නිවන්න.

නැත්නම් ආලෝක සංවේදී සෙන්සර් එකක් හදලා ඒක සවිකරන්න ඕන. එතකොට වීදි පහන ස්වයංක්‍රීයව නිවෙනවා පත්තු වෙනවා. ඒක කවුරුවත් කරන්න ඕන නෑ එතකොට. මොකක් හරි ක්‍රමවේදයක් ඕන. අපේ රටේ විදුලි පරිභෝජනය වැඩි වෙලා තියෙනවා. විදුලි බිල අපි කවුරුත් ගෙවනවානේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** දැන් මන්ත්‍රීවරු 22 ක් ඉන්නවා. වෙන වැඩකුත් නෑ නේ. වීදි පහන් නිවන්න දාමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒකත් හොඳ යෝජනාවක්. ඒ නිසා මම කියන්නේ මෙහෙමයි. මේක විවේචනය කරනවා නෙමෙයි. ඒ ඉල්ලීම තියෙන්නේ විදුලිබල මණ්ඩලයෙන්. අපි සභාවක් විදියට වගකියන්න ඕන. ඒ වගකීම ඔබතුමාට පැවරිලා තියෙනවා. ඒ ලියුම එවන්නේ ඔබතුමාටනේ. ඒකේ වගකීම තියෙනවා ඔබතුමාට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඒකට අනිවාර්යයෙන් ක්‍රියාමාර්ගයක් ගන්නවා. මම දැන් කියලා තියෙන්නේ. වීදි පහන් අලුත්වැඩියා කරන අය දන්නවා ඒ වීදි පහන් මොනවද කියලා. ඒ ටික ලකුණු කර ගෙන එන්න කියලා තියෙන්නේ. මම අනිවාර්යයෙන් ඒ ටික ගලවන් එනවා. මම කියන්නේ මෙච්චරයි. මන්ත්‍රීවරු ඊට පස්සේ එන්න එපා අනේ මේ අපේ මිනිහෙක් මේක හයි කරන්න කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතියි ඒ වගකීම ඔබතුමා ගන්න එක ගැන. මේ රටේ මුදල් නාස්තියක් හැර මේක ප්‍රයෝජනයක් හරි වෙන මොකක් හරි වෙන එකක් නෙමෙයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපි නොකරොත්, විදුලිබල මණ්ඩලයෙන් කරනවා. ඊට කලින් හොඳයි අපි කරන එක.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා, මම ඒකට තව කාරණයක් එකතු කරන්න ඕන. වීදි පහන් නිවා දැමීම සම්බන්ධව ක්‍රියාමාර්ගයක් හරියට නොගත්තොත් ඒකට ක්‍රියාත්මක වෙන එකට මම ගොඩක් සතුටු වෙනවා. ඒක ගොඩක් හොඳයි. නමුත් අපේ විදුලි අංශය දැනුවත් කරන්න ඒ වගේ නීති රෙගුලාසි මෙතන පනවනවානම්. වැසි දිනවලදී ලොකු ප්‍රශ්නයක් තියෙනවා වීදි පහන් නිවන්න බෑ. විදුලිසැර වදිනවා. ඒ චෝදනාව මිනිස්සුන්ගෙන් අපිට ඇවිත් තියෙනවා. ස්වීච් එක නිවන්න ගියාම විදුලි සැර වදිනවා කියලා වැසි දිනවලදී. ඔය කාරණාව ගැන සලකා බලා සුදුසු ක්‍රියාමාර්ග ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම නම් දැකපු දෙයක් තියෙනවා. ඔය ස්වීච් නිවන්නේ නැත්තේ බොහොම සුළු පිරිසක්. වතුර නෙමෙයි මොන දේ තිබුණත් ස්වීච් එක නිවන කෙනා ඒක නිවනවා. ඔබතුමිය කියන කතාවේ සත්‍යතාවයක් තියෙනවා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඒක වෙන්න පුළුවන්. ඒක ඇත්ත. වැසි දිනවලදී පොඩ්ඩක් සැලකිලිමත් වෙන්න කියලා තමයි මම ඉල්ලන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පරණ ස්විච් තියෙන ඒවාගේ මේ ප්‍රශ්නය තියෙන්න පුළුවන්. ඒවා දැන් අලුත්වැඩියා කරගෙන යනවා. පරණ ස්විච් අයින් කරලා අලුත් ස්විච් දාගෙන යනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඒ වීදි පහන් සම්බන්ධව කතා කරද්දි මටත් අදහසක් දක්වන්න ඕන. මගේ කොට්ඨාශයේ පසුගිය දිනක වීදි පහන්

කීපයක් විදුලි බල මණ්ඩලයෙන් ගලවලා තිබුණා. ඒ ගලවා ගත් වීදි පහන කපුහෙම්පල ප්‍රදේශයේ අනතුරුදායක වංගුවක තියෙන්නේ. ජයසුන්දර තෙල් මෝල ගාව වීදි පහන මේ. මම විදුලි අධිකාරිතුමා එක්ක ඒ වෙලාවේම කතා කරා. හවස 03 ට විතර තමයි ගලව ගෙන ගිහින් තිබුණේ. එතන වීදි පහන දවල් පත්තු වෙනවා දැකලා තියෙනවා එතුමා හදිසි ගමනක් යන ගමන්. විදුලි බල මණ්ඩලයෙන් දවස් කීපයක් කියලා තියෙනවා මේ වැඩේ කරන්න එපා වීදි පහන් කට්ටලය ගලවන්න වෙනවා කියලා. මම විදුලි අධිකාරිතුමා එක්ක කතා කරාම කිවුවේ ඒක. ඒ වීදි පහන් කට්ටලය ගලවපු ගමන් මට කතා කරා ඒ ගමේ කීප දෙනෙක්. ඇත්තටම මේක විය යුතු දෙයක් නෙමෙයි. පොදු අවශ්‍යතාවය මත පාරවල් වලට, හන්දි වලට අපි වීදි පහන් සවිකරලා තියෙනවා. ඒකේ වුවමනාව නැති කීප දෙනෙක් ඉන්නවා. ඒ වීදි පහන් අනිවාර්යයෙන්ම ඉවත් වෙන්න ඕන. තොටගොඩ රිචඩ් පතිරණ මාවතේ අද උදේත් වීදි පහන් දෙකක් පත්තුවෙනවා. මම රියදුරු මහත්තයාට පෙන්නුවා. බලන්න මොන තරම් අපරාධයක්ද?. දවසක් මම ගොඩකන්දේ සංස්කෘතික මධ්‍යස්ථානය අසලට යන කොට වීදි පහන් හතක් නිවාගෙන ගියා. මම අසල්වැසි නිවැසියන්ගේ ගේට්ටුවලට තට්ටු කරලා මොන අපරාධයක්ද කියලා දැනුවත් කරලා ගියේ. ඒක විය යුතුයි. මේකේ කිසිම ගැටලුවක් නෑ. හැම මන්ත්‍රීවරයෙක්ම සහයෝගය ලබා දිය යුතුයි. ගමේ ඉල්ලීම, පොදු ඉල්ලීම මත ඒ දේ සිද්ධ වුනා නම් ගම්වැසියන් හැටියට ඒ වීදි පහන නිවා දමන්නේ නැත්නම් දිවා කාලයේදී ඒ වීදි පහන් කට්ටලය ගලවා ගෙන ආවාට අපි කවුරුවත් චෝදනා කරන්න හොඳ නෑ. ඒක සභාවෙන් කළ යුතු නෑ. විදුලි බල මණ්ඩලයෙන් ලස්සනට ඒ වැඩේ කරනවා. ඒ වීදි පහන් කට්ටල අපිට විදුලිබල මණ්ඩලයෙන් නැවත ලබා ගන්න පුලුවන්. විදුලි ඉංජිනේරුතුමාට කතා කරහම කිවුවා වීදි පහන් කට්ටල සුරක්ෂිතව අපි ගාව තියෙනවා. ඇවිත් අරගෙන යන්න කියලා. මේක ජාතික අපරාධයක් නිසා ගැලෙව්වා කියලා බොහොම පැහැදිලිව කිවුවා.

ඊළඟ කාරණය ගරු සභාපතිතුමනි, ආදායම් තත්ත්වය සභාව තුළ ඉතාම අසතුටුදායක තත්ත්වයක තියෙන හින්දා පහුගිය කාලයේ ජංගම සේවාවන් පවත්වලා වරිපනම් බදු මුදල් අයකිරීම සිදුවුණා. අපේ කොට්ඨාශය සම්බන්ධ කර ගෙන ඒ දේ සිදු වුණාද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලබුදූව වෙළඳ සංකීර්ණයේ, මහ හපුගල, සරසවි අසපුවේදී සිදු කරේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඉතුරු කොට්ඨාශවල පෙර වසරවල් එක්ක බලන කොට ආදායම් තත්ත්වය කොහොමද?. මොකක්ද ඒකට හේතුව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වර්තමානයේ මිනිස්සුන්ගේ ආර්ථික තත්ත්වය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** පවතින රජයේ තියෙන දුර්වලතාවයන් නිසා මිනිස්සුන්ගේ ආදායම් තත්ත්වය බොහොම දුර්වල මට්ටමක තියෙන්නේ. ඒක අපි තව මාස තුන හතරකින් යථා තත්ත්වයට පත් කර ගමු. අපි ඒක නැවත ඉතුරු කොට්ඨාශවලත් ක්‍රියාත්මක කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම මෙහෙම දෙයක් බලාපොරොත්තු වෙනවා. ඒක සියලු මන්ත්‍රීවරුන්ට කියන්න ඕන. අපි සාකච්ඡා මට්ටමින් කර ගෙන යනවා කොට්ඨාශ දොළහෙම එක කොට්ඨාශය බැගින් අරගෙන සම්පූර්ණයෙන්ම ප්‍රාදේශීය සභාව සම්බන්ධීකරණය කරලා ජංගම සේවාවල් පවත්වන්න. වරිපනම් බදු මුදල් අය කිරීම වගේම, වරිපනම් බදු මුදල් පිළිබඳව තියෙන ගැටළු, නීති පිළිබඳව තියෙන ගැටළු, පස් කණ්ඩි කැපීම, තාප්ප බැඳීම සම්බන්ධව නීති උපදෙස් දෙන්න උපදේශක කෙනෙකුත් සම්බන්ධ කරනවා. ඊට පස්සේ පළාත් සභාවේ දන්ත වෛද්‍ය සේවාවත් ගෙන්වනවා. පුළුවන් තරම් පළාත් සභාවෙනුත් උදව් අරගෙන මාසයකට එක වරක් ගානේ කොට්ඨාශයකට ප්‍රාදේශීය සභාවෙන් කරන සියලු දේවල් සමග කොට්ඨාශ තුළ මාසයකට එක දවසක් ජංගම සේවාවක් පවත්වන්න. මේ සම්බන්ධව දැනුවත් වීමේ අත්පත්‍රිකාවක් නිවෙස් වලට බෙදලා සම්පූර්ණ වැඩ සටහනක් කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒකම තමයි සභාපතිතුමා මම කියන්න ගියෙත්. ඒක ඇත්තටම ක්‍රියාත්මක වෙන්න ඕන. කොට්ඨාශයේ සියලු පවුල් දැනුවත් කරලා, අත්පත්‍රිකාවක් බෙදලා, පෝස්ටර් ගහලා ඒ වැඩේ කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනතුරුදායක ගස් ඉවත් කිරීම සම්බන්ධව එදාම පුළුවන්නම් තීන්දුවක් අරගෙන ඒ ප්‍රශ්නය ඉවර කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** වරිපනම් විතරක් නෙමෙයි ඒක යන අතරේ තවත් සේවාවන් ඒ ගමේ ජනතාවට ලැබෙන විදියට කරන්න ඕන. දේශීය වෛද්‍ය සායනයක්වත් කරලා දුන්නොත් ඒ මුදල් උනන්දුවෙන් සභාවට ගෙවයි කියලා මම හිතනවා.

ඊළඟ කාරණය තමයි ගරු සභාපතිතුමනි. පොළ භූමියේ ඉදිකරන ගොඩනැගිල්ල. ඒක මම ගිය අයවැය යෝජනා වලදීත් කතා කරා. නිශ්චිත කාලයක් තුළ අපි ඒක අවසන් කරමු. දේශපාලනයේ අපි රැඳෙන්නේ අවුරුදු 04 යි. මම ඒක ඊට කලිනුත් කිව්වා. අපි බැංකු ණය මුදලකට හරි ගිහිල්ලා මේක කරමු. මේ කාලය තුළදී මේක පටන් ගන්නවා, මේක කාලය තුළදී අවසන් කරනවා කියලා සාකච්ඡා කරලා දිනයක් වෙන් කර ගෙන අපිට ඉලක්කයකට යන්න පුළුවන්. නැත්නම් මේක සාකච්ඡා මට්ටමේ විතරයි යන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මාසයක් ඇතුලත සැලසුම් කටයුතු, ඇස්තමේන්තු කටයුතු අවසන් කරන්න පුළුවන්. අනිවාර්යයෙන් මාස දෙකක් තුනක් යන කොට වැඩේ පටන් ගන්න පුළුවන්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මේ ආණ්ඩුවේ කාල සීමාව තව පොඩි කාලයක් තියෙන්නේ. ඒ කාලය තුළදී අපි මේකට මුල්ගල් තිබ්බොත් ඉතාම හොඳයි කියලා මම හිතනවා. ඒ හින්දා ඉක්මනට මුල්ගල් තියමු අපි මෙතුමලත් එක්ක එකතු වෙලා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වීදි පහන් ගැන කතා කරපු නිසා කතා කරන්න ඕන. දැන් එක දෙයක් කිව්වා. ඉලක්ක වලට යන්න ඕන කියලා. ඔබතුමා දන්නවා මේ වීදි පහන් නඩත්තුව සඳහා දරුණුම වියදමක් යන්නේ. ඉතා විශාල වියදමක් යනවා නඩත්තු කරන්න. වැඩේ තියෙන්නේ මේකට අපි මීට කලින් ගෙනාවා බොහොම පැහැදිලිව යෝජනාවක්. ඒ වතාවේ ඒක ගෙනල්ලා කණු අංක කරන කොට මම කිව්වා මේකට ඉලක්කයක් දාගන්න කියලා අවසන් කරන්නේ කවදද කියලා. ජේනවා හිටපු ගමන් ගිහින් කරනවා. ඉලක්කයක් නෑ. ඇයි බැරි මේ වැඩේට ඉලක්කයක් දා ගන්න. මේක හදා ගත්තා නම් ඔබතුමාට කිසි ප්‍රශ්නයක් නැතුව මේ වියදමෙන් භාගෙට භාගයක් අඩු කර ගන්න පුළුවන්. අපි එතකොට දන්නවා බල්බ් එකක් දාපු දවස, චෝක් එකක් දාපු දවස, ස්විච් එකක් දාපු දවස. දැන් මොකක්ද වෙන්නේ කියලා කවුරුවත් දන්නේ නෑ.

ඊයේ පෙරේදා අපි නිකං කතා කර කර ඉන්න වෙලාවක යසරත්න මන්ත්‍රීතුමා කිව්වා ආයතනවල බඩු ගෙනියනකොට, ඒවා ආපහු භාරගන්න කොට කොච්චර ගෙනාවද, වගකීම් කාලය ඇතුලත ඒවා තියෙනවාද, ඒවා කවුරුවත් දන්නේ නෑ කියලා. තමුන්නාන්සේලා හැම කෙනෙක්ම මහා ද්‍රෝහි වැඩක් කරන්නේ. ඇයි ඒකට ඉලක්කයක් දාගන්නේ නැත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා එතනදි වැරදියි. වගකීම් කාලය ඇතුලත මාරු කිරීම්, ඒ සියලු දේ සිදු වෙනවා. ඔබතුමාට ඕන නම් ඉදිරිපත් කරන්න පුළුවන් කවදද බල්බ් එක ගෙනල්ලා තියෙන්නේ, කවදාද වගකීම ඉවර වෙන්නේ, ඒ අතරතුර පිච්චුන බල්බ් මොනවාද?. ඒ සියලු තොරතුරු තියෙනවා.

මෙහෙම දෙයක් තියෙනවා. මමත් පිළිගන්නවා යම් කිසි ගැටළුකාරි තත්ත්වයක් තියෙනවා කියලා. ඒකට එක නිලධාරියෙක් විධිමත්ව පත් කරන්න ඕන විදුලි අංශය සම්බන්ධව. අපිට පාඩු නෑ ඒක. හැබැයි පොඩි ගැටළුවක් තියෙනවා ඒ නිලධාරියා වාහනයේ යන්න කටයුතු වෙන්නත් ඕන. නැත්නම් එතනදී දෙන තොරතුරුයි මෙහේට ගේන තොරතුරුයි අතරේ ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මේ අහන්න. ඔය ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම වෙන් වෙනවා ඔය කාඩ් එක දානවානම් ඒක බොහොම පැහැදිලියිනේ. දැන් අපි දන්නවා බද්දේගම පාරේ, ඊරියගහ හන්දියෙන් යන පාරේ අංක 01 කණුවට කවදද බල්බ් එක දැම්මේ කියලා. හැමදාම බල්බ් එක පිච්චෙනවානම් ඒක ප්‍රශ්නයක්නේ. දැන් මම මේ නිකං කියන්නේ උදාහරණයක්. මගේ ගේ ළඟ කණුවේ බල්බ් එක මම හිතන්නේ අවුරුදු ගාණකට පිච්චිලා නෑ. පහුගිය කාලේ තමයි පිච්චුනේ. අනිත් තැන්වල බල්බ් පිච්චෙන්නේ කොහොමද?. හෙනත් ගහනවා. ගොරවනවා කියනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඔබතුමාගේ ගේ ළඟ හින්දා පිච්චෙන්නේ නැත්තේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔව් ඒ හින්දා පිච්චෙන්නේ නැත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හෙන වෙන පැත්තකට හැරෙනවානේ. ඒකයි වැඩේ. බල්බ් එකට එන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමාලා නිකං හිතන්නකෝ දැන් මේ විදියට ගේන බල්බ් ප්‍රමාණය බැලුවහම අපරාධයක්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි අබේසේකර මන්ත්‍රීතුමා, සේවකයන් තුන් දෙනෙක් විතර ඕන එක තමයි එක සේවකයෙක්ගෙන් කුණු අංක කිරීම කරන්නේ. මේ මාසේ ඉවර වෙන කොට හරි ලබන මාසේ මුල් සති දෙක ඇතුළත හරි කුණු අංක කිරීම සම්පූර්ණයෙන්ම ඉවර වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ලබන සභාව වෙනකොට දෙන්න ඒක ගැන ප්‍රගතිය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ සභාව වෙනකොට මේ වැඩේ ඉවර වෙයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එතකොට බලන්න මේ වියදම කොයි තරම් අඩු වෙනවාද කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** කුණු 100 කට වඩා දවසකට කෙරෙනවා. මමත් බැලුවා ලිපිගොනුව ඉල්ලගෙන. පයින් යන්නේ ඒ වැඩේ කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක නොකෙරෙනවා කියනවා නෙමෙයි. ඒක ඉක්මනට කරන්න ඕන.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, සුභ උදෑසනක් හැම දෙනාටම.

සභාවේ ආදායම අඩුවීම සම්බන්ධව හා වරිපනම් බදු මුදල් එකතු කිරීම සම්බන්ධව අපිටත් තියෙනවා ප්‍රකාශයක් කරන්න. පහුගිය දවස්වල අපි නිවෙස් වලට ඇවිදීමක් කරා. සාමාන්‍යයෙන් ෆිනෑන්ස් ඉඩම්වලත්, පර්චස් 10 ක වගේ ඉඩම් තියෙන අයටත් කුණු ටික දාගන්න තැනක් නෑ. ඒක ගැන මම පහුගිය සභාවක ගෙනාපු යෝජනාවකුත් තිබුණා. වරිපනම් බදු මුදල් ගෙවන්න කැමතියි ඒ මිනිස්සු. නමුත් ඒ මිනිස්සුන්ගේ ප්‍රශ්නත් විසඳෙන්න ඕන. ඒක නිසා මේකට මොකක් හරි වැඩපිළිවෙලක් හදලා ඒ කොට්ඨාශ වල පොඩි ඉඩම්වල ඉන්න අයගේ වරිපනම් බදු මුදල් එකතු කරනවා නම් සභාවේ ආදායම වැඩි කර ගන්න පුළුවන්. හැබැයි ප්‍රශ්නයක් තියෙන්නේ ඒ අතුරු මාර්ග වල තියෙන පොඩි ගෙවල් වලට කුණු ට්‍රැක්ටරය යවන්න බෑ. ඒක නිසා ලෑන්ඩ් මාස්ටර් එකක් වගේ වාහනයකින් තමයි මේ කුණු ටික එකතු කර ගන්න වෙන්නේ. මේ සඳහා අවධානය යොමු කරලා කුඩා ඉඩම් වල තියෙන කුණු එකතු කරනවා නම් මම හිතන්නේ ඒ ජනතාවගේ වරිපනම් බදු මුදල් සභාවට එකතු කර ගන්න පුළුවන්. හැබැයි වරිපනම් බදු මුදල් එකතු කරන එක විතරක් වෙන්න බෑ මෙතනදී. ඒ මිනිස්සුන්ගේ මේ වැඩේ සභාවෙන් කරන්න පුළුවන්නම් හොඳයි කියන යෝජනාව තමයි මම කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි මන්ත්‍රීතුමා ඔබතුමා කියන එක හරි. ප්‍රාදේශීය සභාවක යුතුකමක් තමයි වරිපනම් ගෙව්වත් නොගෙව්වත් අදාළ මිනිස්සුන්ගේ අවශ්‍යතා ඉෂ්ඨ කිරීම. අපි ඒකට බැඳී ඉන්නවා. නමුත් මම සභාපති වුනාට පස්සේ අද වෙනකම් අලුත් මාර්ග එකකවත් කුණු එකතු කරේ නෑ. අපිට කුණු දැමීම පිළිබඳ ගැටළුවක් තියෙනවා. ඒක ගැන අපි හැමෝම දන්නවා. අමුතුවෙන් සඳහන් කරන්න අවශ්‍යතාවයක් නෑ. ඔබතුමාලා දකින්න ඇති මොන්රෝවියා වත්තට කුණු දැමීම නැවැත්තුවහම වෙච්ච ප්‍රශ්නය. ඒක අපි කවුරුත් දැක්කා. වර්තමානය වන විට අපි සාකච්ඡා කරගෙන ගිහින් අවසන් මට්ටමේ තියෙන්නේ කුණු දාහක යන්ත්‍රයක් මිලදී ගැනීමේ කටයුත්ත. ඒක රුපියල් ලක්ෂ අනුවක් විතර වෙනවා. පැය තුනකට වරක් කසළ ටොන් පහක් දහනය කරන්න පුලුවන්. ඒ වගේම තමයි ඉතුරුවෙන්නේ 5% ක් පමණයි. ඒකත් අළු විදියට තමයි ඉතුරු වෙන්නේ. ඒක ගැන තමයි දැනට අවධානය යොමු කරලා තියෙන්නේ. මධ්‍යම පරිසර අධිකාරියෙන් අවසර ලැබෙනවානම් හරි. අපි සාකච්ඡා කරලා තියෙනවා. ඔවුන්ගෙන් විරෝධතාවයක් නෑ ඒක ගැන. ඒ අය කියන විදියට ඒකෙන් ලොකු හානියක් නෑ පරිසරයට. අපිට මධ්‍යම පරිසර අධිකාරියෙන් අවසරය ලැබුණු විගස අපි ණය මුදලක් අරගෙන ඒක හදනවා. මොකද අපි දැනට රුපියල් එක්ලක්ෂ හැට දහසක් - රුපියල් එක්ලක්ෂ අසූ දහසක් අතර මුදලක් මොන්රෝවියා වත්තට කසළ බැහැර කිරීම නිසා ගෙවීම් කරනවා. ඒක වාරිකයක් විදියට අපිට ගෙවන්න පුළුවන්. අපිට හෘද සාක්ෂියට එකඟ නොවන පොඩි ගැටලුවක් තියෙනවා. නමුත් අපිට

වෙන විකල්පයක් නැති විදියට තමයි පේන්නේ. අපි ඒකට යන්න තමයි දැනට සාකච්ඡා කරගෙන යන්නේ. සභාව දැනුවත් කරන්න ඕන නිසා කිවුවේ.

( ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මේ ප්‍රශ්නය කතා කරපු නිසා කියන්නේ. ග්ලැසියර් එක දියවෙලා ගිහිල්ලා තියෙන්නේ. ඒක තුළ වෙන දේ හිතා ගන්න බැනේ. මම හිතන්නේ ලේසියෙන්ම කරන්න පුළුවන් දේ තමයි කසළ බඳුන් ලබා දීම. ඇත්තටම පර්චස් 10 ක 05 ක වගේ ඉඩමක වුනත් අපිට කරන්න පුළුවන් දේ තමයි කසළ බඳුන්. ඒ වුනාට ප්ලාස්ටික් කසළ බඳුන්නම් වැඩක් නෑ. ඒක කවුරුත් අරගෙන ගිහින් දැම්මට වැඩක් නෑ. දැන් නිකං ගත්තොත් එහෙම ඔබතුමා බලන්න අපි සිමෙන්ති වලින් හදන කසළ බඳුන් දුන්නානම් අවුරුදු ගාණක් පාවිච්චි කරන්න පුළුවන්. ඇත්තටම අපේ සභාවට දැන් කරනවානම් ඒකේ සම්පූර්ණ මුදල නිදහස් කරන්න ඕන. බාගයක් ගෙවන එක නෙමෙයි. බාගයක් ගෙවන එක පහුගිය කාලේදී ලබා දුන්නානේ. බාගයක් ගෙවන එක නැතුව දුන්නත් ලාභයි. එතකොට අපිට එකතු කරන්න වෙන්නේ පොලිතින් ටිකයි, වීදුරු ටිකයි, ඒ වගේ දේවල් විතරයි. ඒක ගැන මිනිස්සු දැනුවත් කරලා එහෙම දේවල් වලට යන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එක දෙයක් මම කියන්නම්. අපි පොඩි සමීක්ෂණයක් වගේ දෙයක් කරා. කසළ බඳුන් වලට දාන්න පුළුවන් ඉඳුල්, එළවළු වගේ දේවල් නේ. නමුත් 90% ක් එකතු වෙන්නේ පොලිතීන් කාඩ්බෝඩ් වගේ දේවල්. කසළ බඳුන් ලබා දීලා අපිට පුළුවන් ඉඳුල් වගේ දෛනිකව එකතු වෙන අපද්‍රව්‍ය කළමනාකරණය කරන්න. නමුත් අපි දැක්කා මොන්රෝවියා වත්ත කසළ අංගනයට ගියහම වෙන දේ. දවසකට අපේ ට්‍රැක්ටර් 05 ක් කසළ එකතු කරන්න වැඩ කරනවා. දවසකට ට්‍රැක්ටර් බාගයක් එකතු වුනේ නෑ. ඔක්කොම ට්‍රැක්ටර් යවලත් ඉඳුල් එකතු වෙන්නෙත් නෑ ට්‍රැක්ටර් බාගයක් දවසකට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා මෙහෙම තියෙන්නේ. දැන් ඉඳුල් එකතු කරන එක තමයි හැමදාම කරන්න ඕන දේ. පොලිතීන්, වීදුරු තියෙනවානම් මාසෙකට දවසක් එකතු කරත් මුකුත් වෙන්නේ නෑ. ඉතිං ඉඳුල් ටික ගෙදර තියෙන කසළ බඳුනට දානවා නම් තණකොළ ටික නෙළලා දානවානම්, ඒකට යූරියා ටිකක් දානවානම් ඒක තමයි හොඳම ටික. නමුත් කියන්න කණගාටුයි. මම අද දවසේ ඉල්ලා සිටිනවා පසුගිය කාලේ කසළ බඳුන් ලබා දීමේ ව්‍යාපෘතිය ගියා. මම දන්න විදියට ඒ අවුරුදු දෙකටම ගිහින් තියෙන්නේ කසළ බඳුන් 118 යි. 100 යි, 18 යි. දැන් ඒ මුදල් වලට මොකද වුනේ. නැවත චක්‍රයක් එනවානම් ඒ ව්‍යාපෘතිය ගෙනියන්න පුළුවන්. අපිට ඒ කසළ බඳුන් 118 බෙදුන විදියයි, කාට කාටද දීලා තියෙන එකයි, ඒ වගේම ඒ එකතු වුන මුදල් මොන ගිණුමේද තියෙන්නේ කියලා කියන්න. ඒවාට වෙනම ගිණුමක් යන්න ඕන. එහෙම නැත්නම් යන්න බෑ. ඒ මුදල් තව දේකට ගත්තම යන්න බෑ. ගරු සභාපතිතුමා අපිට ඒ ගැන විස්තර සභාගත කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා මෙහේ ගිණුම් වර්ග තියෙනවානේ. ඒ ගිණුම් වලට අමතරව අලුතෙන් වෙනත් ගිණුම් ආරම්භ කරන්න බෑ. ඒ මුදල සභා අරමුදලේ තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ මුදල සභා අරමුදලේ තියෙනවා කිවුවට ඒ මුදල් තියෙන්නේ මොකක් හරි ගිණුමක් ඇතුලෙනේ. ඊට පස්සේ අවුරුද්දේ කසළ බඳුන් 18 යි ගෙනාවේ. 100 ම ගේන්න පුළුවන්නේ. අඩු ගාණේ 100 ක් 200 ක් වත් අපිට ගේන්න පුළුවන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අපේ මුදල් නෙමෙයි අබේසේකර මන්ත්‍රීතුමා. අපේ මුදල් ශත පහක්වත් ඒකේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපේ මුදල් ශත පහක්වත් නැති වුණාට එකතු කර ගනිපු මුදල් ඇති නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගිණුමේ තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකෙන් තව ගේන්න පුළුවන්නේ. ඒ චක්‍රය ගියේ නෑ නේ. ඒක කී වාරයකටද එකතු කරන්න දාලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන මම දකින වැරැද්දක් තියෙනවා. ඒ මුදල් අනිත් ඒවාට වියදම් කරලා හරි යන්නේ නෑ. ඒ මුදල් දාන්න වෙනම ගිණුමක් ආරම්භ කරන්න බැරිවුණාට ඒ බඳුන් සඳහා මුදල් තියෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා දන්නවා පහුගිය කාලේ අපි හිටපු සභාවල ස්ථිර තැන්පතු දැම්මුවා. වැඩි පොලී දෙන තැන්වලට ගිහින් මිල ගණන් කැඳවලා වැඩි පොළියට ස්ථිර තැන්පතු දැම්මා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට දැන් වෙලා තියෙන දේ තේරෙනවා. අපි කියනවා කෝටි තුනක ප්‍රතිපාදන දෙනවා කියලා අවුරුද්දකට. නමුත් අපිට මුදල් එන්න ඕන ඒ ප්‍රතිපාදන දෙන්න. මුදල් අය වෙන්න ඕන නේ. ඒ මුදලේ ප්‍රශ්නයක් වෙලා තමයි වියදම් වෙලා තියෙන්නේ. ඒ මුදල් ගිණුම් වල තියෙනවා. නමුත් වෙනත් දේවල් වලට වියදම් කරලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නමුත් එකක් තියෙනවා අපි කරන්න ඕන ඒක නෙමෙයි. එහෙමනම් අපි පාර හදන එක, තාප්පයක් හදන එක අඩු කරලා වැඩ කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක හරි. ඒක නෙමෙයි කරන්න ඕන. සීයක් ගෙනාවා නම් අපිට පනහක මුදල් නේ එන්නේ. 50% නිදහස් කරානේ. තව පනහක් ගේන්න ඕන ඒ සීය වෙනුවට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම දකින්නේ ඔබතුමා වෙනම මේ පිළිබඳව කතා කරලා, සාකච්ඡාවක් දාලා බලන්න. මම දකින්නේ මේ ප්‍රශ්නයට සාර්ථකම විසඳුම මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හරි. ඒකට අපි වෙන්න ඕන දේ බලමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ කාරණයේදී සභාපතිතුමා කසළ බඳුන් 118 ක් බෙදුවා නම් ඒවා තැන් තැන් වල ඇති නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 118 ක් බෙදුවා නම් හෙට ගේන්න පුළුවන් වෙන්න ඕන 60 ක්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඊට වඩා කාරණය තියෙන්නේ ඒවා තැන් තැන් වල ස්ථාන ගත කරලා තිබුණට අපේ කසළ වාහනය යන්න ඕන. වියදම් අඩු වෙලා නෑ. ඒක තෝරාගත් ප්‍රදේශයකට ඒ කසළ බඳුන් යොමු කරනවා නම් කුණු ප්‍රශ්නය අඩු කර ගන්න තිබුණා. අපිට ඕන අපේ පිරිවැය අඩු කර ගන්න කොහොම හරි. නිකං බෙදලා අපිට යන පිරිවැය ඒ විදියටම යනවා නම්, සභාවට ඒ කරපු වියදමෙන් ප්‍රතිලාභයක් නැත්නම්, ඒක සාර්ථක නෑ කියන එක නේ කියවෙන්නේ. එහෙම නම් අපි කරන්න ඕන කොම්පෝස්ට් බඳුන් එක ප්‍රදේශයකට බෙදන එක. එතකොට ඒ ප්‍රදේශයේ කුණු ප්‍රමාණය අඩු වෙන්න ඕන. එහෙම ගණනය කිරීමක් නැත්නම් අපි මේ කරන දේ තේරුමක් නැති වෙනවා නේ. අපි තැන් තැන්වලට බෙදුවා කියලා එන ප්‍රතිලාභය සභාවට දැනෙන්නේ නෑ. ගැටළු සහගතයි. මේකට අපි ක්‍රමවේදයකට යන්න ඕන. අපි ප්‍රදේශයක් ඉලක්ක කරගෙන කසළ බඳුන් බෙදන්න ඕන. ඒකේ ප්‍රතිලාභය එන්න ඕන. ඒක තමයි බලාපොරොත්තු වෙන්නේ. එහෙම ක්‍රමවේදයක් තියෙන්න ඕන. ඒක සාර්ථක, තාර්කික ක්‍රමවේදයක් වෙන්න ඕන. එහෙම නැතුව අපි කාටහරි, තැන් තැන්වල බෙදුවා කියලා වැඩක් නෑ. ඒක ගැන බලන්නෙත් නෑ. මොනිටර් වෙන්නෙත් නෑ. ප්‍රශ්නයක් තියෙනවා ඒක ගැන. සභාපතිතුමනි, අපි වෙනම කතා කරමු කුණු ප්‍රශ්නය ගැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මන්ත්‍රීතුමා උදාහරණයක් විදියට සෙන්ට්‍රිටාස් ගම්මානයට කසළ බඳුන් 25 ක් දීලා තියෙනවා. නමුත් ඉතිං කසළ ට්‍රැක්ටරෙත් යවන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එතකොට අපේ ඒ වැඩේ සාර්ථක වෙලා නෑ නේ. ඔබතුමාට මතකයිනේ කසළ කළමනාකරණය සම්බන්ධව අපි කමිටුවකුත් කතා කර ගත්තා. මේවා යාවත්කාලීනව අපි ඉස්සරහට අරගෙන ගියානම් සභාව ඇතුළේ හැමදාම මේ දේවල් කතා කරන්න ඕන නෑ. සභාව ඇතුළේ කතා කරන්න ඕන ආපු යෝජනා හෝ ප්‍රශ්න කතා කරලා ප්‍රතිඵලය කතා කරන්න පුළුවන් වෙන්න ඕන. කමිටුව ඇතුළේ අපි ක්‍රමවේද සාකච්ඡා කරලා සභා අනුමැතිය අරගෙන ක්‍රියා කරන්න ඕන. අපි දිගින් දිගට අවුරුදු දෙකක් තිස්සේ කතා කරානේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගමේ අයව දැනුවත් කරන්න ඕන කසළ බඳුන් දීපු ප්‍රදේශ වලට කසළ වාහනය එන්නේ නෑ කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දිරාපත් නොවන වියළි කුණු විතරයි එකතු කරන්න ඕන. ඒක එකතු කරලා වෙනම තියන්න කියන්න ඕන. ක්‍රමවේදයක් තියෙන්න ඕන නේ. මෙතනින් ඉදිරියට අපි ඒ ක්‍රමවේදයට සූදානම් වෙනවා නම් මීට වඩා සාර්ථක ප්‍රතිලාභ අත්පත් කර ගන්න පුළුවන්.

( ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා සභාවට සහභාගිවීමට සිදුවිය.)

**<u>(ඈ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ-</u>** නැත

**<u>(ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ-</u>** නැත

**<u>(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

**<u>ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** අප බලප්‍රදේශයේ දිරාපත් වූ වීදි ලාම්පු වෙනුවට අලුතෙන් සවිකිරීම සඳහා විදි ලාම්පු කට්ටල 50 ක් මිලදී ගැනීමට මම යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ පිළිබඳව කියන්න ඕන. මේ ඉල්ලන්නේ කොට්ඨාශයට නෙමෙයි. සභාවට ඇවිත් ඉල්ලීම් කරනවා කැඩුණු, දිරාපත් වූ ලයිට් සෙට් වෙනුවට අලුතින් ලයිට් සෙට් සවි කරන්න කියලා. ඒකට වෙනම ලේඛනයක් තියෙනවා. හපුගල කොට්ඨාශයේ මම ආවට පස්සේ ලයිට් සෙට් 04 ක් 05 ක් වගේ සවි කරේ. පොදුවේ කොට්ඨාශයේ මන්ත්‍රීවරුන්ටත් අහු නොවන, මිනිස්සු මෙතනට ඇවිල්ලා පැමිණිලි කරන, චෝදනා කරන ඒවාට තමයි මේ ඉල්ලන්නේ. අවුරුද්දකට වීදි පහන් නඩත්තුව සඳහා වියදම් කරන්න පුළුවන් මුදල් සීමාවක් තියෙනවා. ලක්ෂ 30 යි ඒක. දැන් ඒ ලක්ෂ 30 සීමාව ඉක්මවන්න ආසන්නයි. දැන් ගැටළුවක් තියෙනවා නව වීදි පහන් කට්ටල මිලදී ගැනීම සම්බන්ධව. අලුත්වැඩියා කරන්න අවශ්‍ය උපාංග විතරයි දැනට ගේන්න පුළුවන්. අර්බුදයක ඉන්නේ. වැඩි ප්‍රමාණයක් ගෙනැල්ලා තියෙන්නේ මේ වෙන කොට.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගිංතොට කොට්ඨාශයේ දිරපු ටියුබ් ලයිට් සෙට් 07 ක් 08 ක් තියෙනවා. ඒවා ගැන මම කියලා තියෙනවා. ඒවා හදන්නෙත් නෑ. දැන් මාස 06 ක් 07 ක් තිස්සේ ඒවා එහෙමම තියෙනවා. අත්‍යාවශ්‍ය තැන් ටික ඒ. හදන කට්ටියත් දන්නවා. හයි කරන්න බෑ කියලා එහෙමම තියෙනවා. දිරපු ඒවාට දැන් මේ ගේන වීදි ලාම්පු කට්ටල වලින් ටිකක් දාලා දෙන්න. වීදි ලාම්පු සවි කරන අයට දුන්නම එයාලා සවි කරාවි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබ්දුල් අසීස් මාවතේ කුණු දාන තැනට ලයිට් සෙට් එකක් සවි කරා. ඉල්ලීමක් තිබුණනේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** කැඩුණු වීදි ලාම්පු කට්ටල එයාලා හදන්නේ නෑ. හදන්න බෑ කියලා කියනවා ඒ කට්ටිය. ටියුබ් ලයිට් දාන්න කාලයක් ගත වෙනවා. දිරලා තියෙන ඒවාට අලුතෙන් ලයිට් සෙට් එකක් දාන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අලුතෙන් ගෙනාවහම බලමු.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** ගිංතොට, වැලිපිටිමෝදර ශ්‍රී ථූපාරාම රජ මහා විහාර භූමිය මැදින් ශ්‍රී භාරද්වාජ මාවතට පිවිසීමට ඇති මාර්ග කොටස වෙනුවට විහාර භූමිය කෙළවරින් විකල්ප මාර්ග කොටසක් ලබා දීමටත්, විහාරය මැදින් දිවෙන මාර්ගයේ බිම් කොටසේ අයිතිය විහාරස්ථානයට පැවරීමටත්, විකල්ප මාර්ගයේ බිම් කොටසේ අයිතිය විහාරස්ථානයෙන් ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒකට හාමුදුරුවෝ ඉල්ලීමක් කරලා තියෙනවා. ගිවිසුමකටත් ගිහින් තියෙනවා. ඒ ලිපිය හමුවුනාද දන්නේ නෑ. ඔබතුමා ඒක බලන්න. මේක දිගින් දිගටම සාකච්ඡා කරපු කාරණයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** කහදූව වත්ත හන්දියේ සිට පිලාන කඩේ මංසන්ධිය දක්වා (එනම් හපුගල හන්දියටත්, බටුවන්තුඩාවටත්, පිවිසෙන හන්දිය දක්වා) මාර්ගය අනගාරික ධර්මපාල බෝධිරාජ මාවත නමින් නම් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක සහස්‍රා යෞවන සමාජයේ ඉල්ලීමක් අනුව සිදු කරේ. මේකට අපි කොහොමත් ක්‍රමවේදයකට යන්නේ. විරෝධතා කැඳවලා ඒ අවශ්‍ය අනුමැතියට යවන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම නිකං මේ කියන්නේ. මාර්ග නම් කිරීම පිළිබඳව නිර්ණායක ටිකක් හදා ගන්න. රණවිරු මාවත් විදියට නම් කරන්න ගියහම ඉතුරුවක් වෙන්නේ නෑ. නැත්නම් ලංකාවේ හැම ගමටම ධර්මපාල මාවතක් තියෙන්න ඕන. රාහුල මාවතක් තියෙන්න ඕන. ඒවගේ තියෙන්නේ. මේ ධර්මපාල මාවත් තොගයක් තියෙනවානේ. මම මේ ඒ ශ්‍රේෂ්ඨ මිනිස්සුන්ට අගෞරවයක් කරනවා නෙමෙයි. මේ ගැනත් අවධානය යොමු කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි විරෝධතා කැඳවලා කරන්නේ ඒක.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 04.** දකුණු පළාත් සභාව තුළ පිහිටා ඇති දුරකථන පහසුකම් නොමැති පාසල් වෙත දුරකථන සහ අන්තර්ජාල පහසුකම් ලබා දෙන මෙන් ආණ්ඩුකාරතුමා වෙත දන්වා යැවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒකට ඉල්ලීම් ලිපියක් ආණ්ඩුකාරතුමාට යවන්න මම යෝජනා කරේ. මොකද පළාත් සභාවේ පාසල්වල දරුවන්ට ඒ අවශ්‍ය දැනුම ලබා ගැනීමට අන්තර්ජාල පහසුකම් ලබා දෙන්න කියලා ගුරුවරුන්ගෙන්, දෙමාපියන්ගෙන් ඉල්ලීමක් තියෙනවා. පළාත් සභාව මඟින් පාලනය වන පාසල් සඳහා ඒ පහසුකම් ලබා දෙන්න කියලා ආණ්ඩුකාරතුමාට ඉල්ලීම් ලිපියක් යවන්න.

ඒ වගේම දුරකථන පහසුකම්වල අවශ්‍යතාවය තියෙනවා රටේ තියෙන ප්‍රශ්නත් එක්ක. විදුහල්පතිවරු කීපදෙනෙක් මට ඉල්ලීම් කරා. ඒ නිසා ඒ පහසුකම් ලබා දෙන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම නම් කියන්නේ දුරකථන පහසුකම්නම් අවශ්‍යයි. අන්තර්ජාල පහසුකම් සඳහා ඔබතුමන්ලා අපේ ආණ්ඩුවට විහිළු කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ටැබ් දීලානේ තියෙන්නේ. ඒ නිසා ඕනත් නැනේ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** කොබෙයියා ඕන වෙලාවට ක්‍රියාත්මක වෙනවානේ දැන්. තව වෙනතුරු ජනාධිපති අපේක්ෂකයා තෝරා ගන්න බැරුව දුක් විඳිනවා. දවසින් දවස කල් යනවා. අපි කියපු දවසට නියම වෙලාවට අපේ අපේක්ෂකයා පත් කරා. ඒ නිසා ඊළඟ මැතිවරණයෙන් විශිෂ්ට ජයග්‍රහණයක් ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ගේනවා. රට ඉල්ලපු නායකයා තමයි අපි පත් කරේ. එක්සත් ජාතික පක්ෂය ඇතුලේ දහදෙනෙක් විතර ඉල්ලනවානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කියන්න තියෙන්නේ වෙන දෙයක් නෙමෙයි. මගේ දූකට නුඹ නාඩන් උලලේනෝ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම මේ සභාවේ අභියෝග කරනවා. ලියලා තියා ගන්න. ගෝඨාභය රාජපක්ෂ නෙමෙයි ඉල්ලන්නේ. ශිරන්ති රාජපක්ෂ. ඔබතුමාලගේ අපේක්ෂිකාව ශිරන්ති රාජපක්ෂ. අක්කා දෙන්නේ. මල්ලි පෙන්නලා අක්කා දෙන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** තව කරුණක් කියන්න ඕන. මේ දවස්වල අපි මොන දේශපාලනය කරත් සියලු දෙනා අවසානයේදී ජය පැරදුම පිළිගෙන අයින් වෙන්න එපැයි. ඒක තමයි දේශපාලනය කියන්නේ. නියම මහත්මා දේශපාලනය කියන්නේ ඒක. මේ දවස්වල මට ලොකු දුකක් වේදනාවක් තියෙනවා රාජිත සේනාරත්න ඇමතිතුමා ගැන. ඒ මනුස්සයා පිටරට ගිහින්, සිංගප්පූරුවට ගිහින් වෛද්‍ය ප්‍රතිකාර ලබලා ඇවිත් ඉන්නේ. ඒ නිසා මේ වෙලාවේ එතුමා බෙරිහන් දෙන විදිය දැක්කම ජනාධිපති අපේක්ෂකයා තෝර ගන්න බැරුව දුක හිතෙනවා. සජිත් ප්‍රේමදාස මහත්තයා ඉල්ලනවා. රාජිත සේනාරත්න මහත්මයා ඉල්ලනවා. ඒ හින්දා පොර කන්නේ නැතුව එකමුතුවෙලා අපේක්ෂකයා දාන්න. අපි අවශ්‍ය කෙනා දාලා තියෙන්නේ. කිසිම ගේමක් නෑ. ඔබතුමාලා භේද නොවී අපේක්ෂකයා දාන්න. මේ ප්‍රශ්නය ඔබතුමාලාගේ ගෙනාවේ දැන්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපේ පක්ෂය ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක්. අපේ පක්ෂයේ අපි සාමූහිකව ඔක්කොම එකතු වෙලා පක්ෂ නායකතුමත් ඇවිල්ලා තීන්දුවක් අරගෙන පක්ෂයට බලතල දීලා තියෙනවා ජනාධිපති අපේක්ෂකයා තෝරන්න.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඇයි හරීන් ඇමතිතුමා වෙනම යන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එහෙම වෙනම යන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාලගේ ඉන්න හොඳම අපේක්ෂකයා දෙන්නකෝ.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** අපි ගේන්නේ ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ලබා ගත් කෙනෙක්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔය ගනුදෙනුව විසඳගන්නකන් අපි පහළට යන්නම්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ කාරණයට අදාළව ආවේ මන්ත්‍රීතුමා. ඒ යෝජනාවට අදාළව කරුණු ටිකක් එකතු කරේ. එහෙම ඔබතුමා කලබල වෙන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. අපි කිවුවා නොකිවුවා කියලා වෙනස් වෙන්නේ නෑ. එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයා අපිට වැඩකුත් නෑ. අපේ අපේක්ෂකයා නම් කරලා තියෙන්නේ. ඔබතුමාලගේ අපේක්ෂකයා විදියට ඕන කෙනෙක් දාන්න. අපිට කවුරු දැම්මත් ලොකු නෑ. මේක මෙතනින් ඉවරයි. හොඳම අපේක්ෂකයා දාන්නකෝ. ඒක ඉවරයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් කවුද දාන්න ඕන.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** හොඳම කෙනා දාන්න. ඔබතුමාලගේ හොඳම කෙනා දාන්න. කිසි ගැටලුවක් නෑ. අපේ අපේක්ෂකයා අපි ඉදිරිපත් කරලා තියෙන්නේ එච්චරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 05.** කපුහෙම්පල සෞඛ්‍ය මධ්‍යස්ථානය සඳහා වතුර ටැංකියක් මිලදී ගෙන සවිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** කපුහෙම්පල ප්‍රාදේශීය සෞඛ්‍ය මධ්‍යස්ථානයේ පහුගිය දවස්වල ප්‍රතිසංස්කරණය කරා. ඒකට වතුර ටැංකියක අවශ්‍යතාවය තියෙනවා. ඇස්තමේන්තුවලට ඒක ඇතුළත් වෙලා නෑ. දැන් සායන ගොඩනැගිල්ලේ වැඩ කටයුතු කරනවා. වතුර නැති නිසා ලොකු ගැටළුවක්. ඒකට වතුර ටැංකියක් සවි කරන්න කියලා යෝජනා කරනවා. යකඩ බාර් හතරක් හරි පාස්සලා ඒක කරන්න. ඉක්මනට අවශ්‍යයයි ඒක.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ස්ලැබ් එකක් තියෙනවා නේද?. ඒක උඩින් තියන්න බැරිද?.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එතන ශාලාවක් හදලා තියෙන නිසා අවහිරයක් වෙනවා. වහල ගහලා ඉවරයි ඒකේ. එකේ ප්‍රජාශාලාවක් විදියට රැස්වීම් කටයුතු කරනවා. වෙනම ස්ටෑන්ඩ් එකක් හදලා වතුර ටැංකියක් සවිකරන්න. ස්ලැබ් එක උඩ තිබ්බහම ශාලාවට අවහිරයි. ශාලාවේ ඇතුලේ පැත්තෙන් තියන්න බෑ. ලිටර් 500 ටැංකියක් තිබ්බහම ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 06.** කපුහෙම්පල සිල්වර් ගාර්ඩන් II මාර්ගයේ ඇති හරස් මාර්ගයේ (ප්‍රාදේශීය ලේකම්තුමාගේ නිවසට යන මාර්ගය) අවශ්‍ය ස්ථාන සඳහා හියුම් පයිප්ප යෙදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ප්‍රාදේශීය ලේකම්තුමාගේ ගෙවල්වලට යන පාර මේක. ඒ බෝක්කුව කඩා වැටිලා හිරවෙලා තියෙනවා. නැවත ප්‍රතිසංස්කරණය කරද්දි ඒ බෝක්කුව දාලා නෑ. සභාපතිතුමනි, ඒකට සිලින්ඩර් දෙකක් යොදවලා ක්ෂණිකව ප්‍රීමික්ස් කරන්න ඕන. මොකද ඒ ප්‍රදේශයේ වෛද්‍යවරු, ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු කාර්යබහුල පිරිසක් ඉන්නේ. එදාම ප්‍රීමික්ස් කරලා අවසන් කරන්න ඕන. කැටගල් අල්ලපු පාරක් මේක. දෙපාරක් කරන්න තියා ගන්න බෑ. අවශ්‍ය බඩු ටික ගෙනල්ලා ඒ කටයුත්ත කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 07.** කපුහෙම්පල කොට්ඨාශයේ දිරාපත් වූ වීදි ලාම්පු වෙනුවට අලුතෙන් සවි කිරීම සඳහා වීදි ලාම්පු කට්ටල 30 ක් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වොට් එකේ මුදල් බලලා ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්නම්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(සභාව තේ පානය සඳහා කල් තබන ලදි.)**

<u>ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ- 08.** පෝද්දල, බඳුවත්තට යන මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** එක යෝජනාවයි දැම්මේ. යෝජනා දැම්මට කරන්න අමාරු නිසා. ගම්වාසීන්ගේ ඉල්ලීමක් අනුව තමයි මේ යෝජනාව මම ඉදිරිපත් කරේ. ඒ පාරේ යන්න බෑ. මම හිතනවා නව රජයක් යටතේ අපිට මේ දේවල් කරන්න පුළුවන් කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ- 09.** ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු ජල බවුසරය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් හෝ දුරකථන ඇමතුමක් ලබා දුන් විට දින 07 ක් ඇතුළත මුදල් ගෙවීමේ සහන කාලයකට යටත්ව ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

එසේ එම දින 07 ඇතුළත ගෙවීම් පැහැර හැරීමක් සිදු කළ විට බවුසරය රඳවා ගත් දින ගණන හා ජලයේ වටිනාකම හා සියලු අයකිරීම් සමඟ දඩයක් වශයෙන් රුපියල් 1000/- ක් සමඟ එම මන්ත්‍රීවරයාගේ මාසික දීමනාවෙන් හෝ ඔහු වෙනුවෙන් එම කාලය තුළ ගෙවනු ලබන ඕනෑම මුදලකින් සභාවට මුදල් අය කර ගැනීම අනිවාර්යයෙන් සිදු කළ යුතු බව යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ ප්‍රායෝගික තත්ත්වය මොකක්ද කියලා පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් විමසන්න ඕන. අඩුම තරමේ දඩය කෙසේ වෙතත් ඒ මුදලවත් මන්ත්‍රීවරයාගෙන් ගන්න පුළුවන් තත්ත්වයක් බලමු.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මේ සභාව අනුමත කරලා දුන්නම ආණ්ඩුකාරතුමාගෙන් අවසර ගන්න ඕන නෑ. සභාව කැමැත්ත දුන්නහම තව කාගෙන්වත් අහන්න ඕන නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එක බවුසරයක් දෙකක්නම් පුළුවන්. බවුසර් පහක් හයක් ගත්තොත් බෑ නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එහෙම වෙන්නේ නෑ සභාපතිතුමා. කොරහේ කිඹුල්ලු දකින දේ ඔබතුමා කරන්නේ. මේක යෝජනා කරලා තිබුණට අවශ්‍ය කෙනා විතරයි මේකට මැදිහත් වෙන්නේ. ගියවර ප්‍රායෝගිකව මේ වගේ දෙයක් කරා මම. දුරකථන ඇමතුමක් ලබා දුන්නහම මට කිව්වා මුදල් බඳින්න කියලා. මුදල් බැඳලා මම වතුර බවුසරය ලබා ගත්තා. ඒ වගේ මේ මන්ත්‍රීවරු ඒ වගකීම එදාට ගනීවි. ඔබතුමා කලබල වෙන්න එපා. යෝජනාව ස්ථිර කරලා තියෙනවා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** යෝජනාව ස්ථිර වුනා හරි. මේකේ ක්‍රමවේදය කියන්න එපැයි. පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් මේකට එකඟතාවය ගන්න ඕන.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ජල සම්පාදන මණ්ඩලයෙන් ජල බවුසරයක් ඉල්ල ගන්න කොට ජල සැපයුම අවශ්‍ය කෙනා විසින් මේ කාර්යාලයට පැමිණ බිල්පතක් ගෙව්වට පස්සේ ජල බවුසරය ලබා දෙන්න පුළුවන් කුමන වෙලාවටද කියලා වැඩ පරීක්ෂක මහත්තයා තීරණය කරලා රියදුරු මහත්තයාට කතා කරලා ජල බවුසරය ඒ ස්ථානයට යවන්නේ. සමහර අවස්ථාවල ජල බවුසරයක් යවා ගැනීමට නොහැකි අවස්ථාත් මතු වෙනවා. සමහර වෙලාවට ට්‍රැක්ටර් කැඩිලා තියෙනවා. එහෙම තත්ත්වයක් මේ සභාවේ තියෙන්නේ ජල සැපයුම පිළිබඳව. එතනදී ට්‍රැක්ටර් රථ සීමිතයි. රියදුරන් සීමිතයි. ජල බවුසර් ඇණවුම් කරන්න අනිවාර්යයෙන් දිනකට දෙතුන් දෙනෙක් සභාවට පැමිණෙනවා. ඒ එන මිනිස්සුන්ගෙන් එක්කෙනෙකුටවත් මේ පහසුකම සපයන්න බැරි අවස්ථා මතුවෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කණගාටුයි සභාව ගැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බවුසර් දෙකයි තියෙන්නේ. මොකක්ද කණගාටුව. කුණු ටික ඇද්දට පස්සේ තමයි වතුර බවුසර් යවන්න වෙන්නේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** පරිපාලන කාරණාවල තත්ත්වය මම දන්නේ නෑ. වතුර බවුසර් සැපයීමේ ඇත්ත තත්ත්වය ඒකයි. එවැනි තත්ත්වයක් තුළ මේක කිසිසේත්ම කරන්න බෑ. ඊගාවට මේ යෝජනාවට මම පුද්ගලිකව විරුද්ධයි. මන්ත්‍රීතුමා යෝජනා කරලා තියෙනවා " ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු ජල බවුසරයක් ලබා ගැනීම සඳහා ඉල්ලීමක් හෝ දුරකථන ඇමතුමක් ලබා දුන් විට" කියලා, මන්ත්‍රීවරයා සභාවට දැනුම් දුන්නහම සභාවෙන් ජල බවුසරය මුදල් ගෙවීමේ සහන කාලයකට යටත්ව යවන්න ඕන. මම මේ යෝජනාවට විරුද්ධයි. මට යෝජනාවට විරුද්ධව අදහස් දක්වන්න අයිතියක් තියෙනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම එතුමාගේ යෝජනාවට පක්ෂයි. ඒකට හේතුව තමයි පසුගිය දවසක පෝය දිනයකදී ජල බවුසරය ලබා ගන්න සතියකට කලින් ඉල්ලුවා. ඒත් ජල බවුසරය හම්බවුනේ නෑ. ඒ බවුසර් වෙනත් ස්ථාන වලට ගියා. ඒක ගැන මම කතා කරන්න යන්නේ නෑ. එම යෝජනාවට මගේ පක්ෂපාතීත්වය ප්‍රකාශ කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පක්ෂ වුණත් විපක්ෂ වුණත් එකම කාරණාවයි තියෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒ මන්ත්‍රීවරයා ඒ යෝජනාව ගේන්නේ සතියකට කලින් බව දැනගෙන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සතියකට කලින් නෙමෙයි කියන්නේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** සතියකට කලින් කතාවක් මේ යෝජනාවේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සතියකට කලින් නෙමෙයි කියන්නේ. ගෙවීම් කරන්න දින හතක් ඉල්ලන්නේ. සතියකට කලින් ඇණවුම් කරනවා නෙමෙයි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මේකේ තව පැත්තක් තියෙනවා ප්‍රියන්ත මන්ත්‍රීතුමා. දුරකථන ඇමතුමෙන් පැහැදිලි කරන්න බෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා ඉන්නකෝ. ඒක කියන්න අරින්න.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මම ඇත්තටම ගෞරවකරනවා සුගත් මන්ත්‍රීතුමාට. ඔබතුමා විරුද්ධ වෙලා ප්‍රායෝගක තත්ත්වයන් ඉදිරිපත් කරා. නමුත් ඔබතුමා දැන ගන්න සභාවෙන් වතුර වලට සල්ලි බැඳලා තියෙන්නේ. ඒ අනුව තමයි මේ යෝජනාව කරන්නේ. ඔබතුමා ගිය සභා වාර්තාව අධ්‍යයනය කරලා නෙමෙයි අද විරෝධතාවය දක්වන්නේ. ඔබතුමාලම තමයි දුරකථන ඇමතුමක් ලබා දීලා කඩිමුඩියේ ඉල්ලන්නේ. අපි නෙමෙයි. පාලක පක්ෂයේ ඔබතුමාලා. එතකොට අතන සිද්ධිය වුණහම, දින හතකට කලින් නෙමෙයි, මරණ අපිට කියලා වෙනවාද?. ඔබතුමා මතක තියා ගන්න මහජන නියෝජිතයෙක් විදියට තමන් නියෝජනය කරන ජනතාව වෙනුවෙන් මේ යෝජනාව දාලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඔබතුමාට යෝජනා කිරීමේ අයිතිය තියෙනවා. මටත් විරුද්ධ වීමේ අයිතිය තියෙනවා. ඒකට ඔබතුමාට විරුද්ධ වෙන්න බෑ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එහෙමනම් ඔබතුමාට මගේ යෝජනාවට විරුද්ධ වෙන්න බෑ. දැන් ඔබතුමා විරෝධය දැක්වුවානේ. කරුණු කිවුවනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අහන්නේ මෙච්චරයි. එකම දෙයයි. ජල සම්පාදන මණ්ඩලය අපිට වතුර ණයට දෙනවාද?. ණයට දෙන ක්‍රමවේදය සභාවක් විදියට අපිට හදන්න බෑ. අපි පළාත් පාලන කොමසාරිස්ගෙන් උපදෙස් ගන්න ඕන එකක්. අනිත් එක අපිට තියෙන්නේ ජල බවුසර් දෙකයි. දැන් මන්ත්‍රීවරු ඔක්කොම ඉල්ලනවා. එතකොට පොදුවේ අපිට අනිත් මිනිස්සුන්ට කරන්න පුළුවන් තත්ත්වය මොකක්ද?. මේවා අනිත් එක යන්නේ, එකෙන් දෙකෙන් පස්සේ. ඒකේ අගය බලන්නත් ඕන. මේ යන අයගේ කකුල් දෙක අල්ලලා වඩින්නේ නැති එක විතරයි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඇයි ඒ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක වෙන්නේ මන්ත්‍රීතුමා මෙහෙමයි. අතිකාල දාන්න ඕන. අතිකාල නැති වුනොත් වතුර බවුසර් ගෙනියන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** සභාපතිතුමා, ඔහොමනම් සභාවේ තත්ත්වය අපි ඔය පුටුවේ ඉන්න දවසක අපි පෙන්වන්නම් කරන විදිය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඉතිං ඊට එහා කියන්න ගියොත්, කාටවත් තේරෙනවා ඇති මම කියන්නේ කවුරු ගැනද කියලා ඔබතුමාලා ඔය කයිය ගැහුවට.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ලැජ්ජයි. සභාවේ අතිකාල ගෙවන්නේ නැත්නම් වැඩ කරන්නේ නෑ කියන එකනේ ඔබතුමා දැන් කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට කියන එක තේරෙන්නේ නැත්නම් කැලි අල්ලගෙන කතා කරන්න එපා. මම කියන එක අහන්න. නැත්නම් ඔබතුමා කියලා වාඩි වෙන්න.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මට යෝජනා ටික ඉදිරිපත් කරන්න දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ යෝජනාව ගැන කතා කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒ යෝජනාව ගැන මම මීට පෙර සභා වාරයේදී අහලා ඇති. ජල සම්පාදන මණ්ඩලයට තැන්පත් මුදලක් තියන්න ඩඩ්ලි මන්ත්‍රීතුමා කරපු යෝජනාවට තැන්පත් මුදලක් තියලා තියෙනවා. එතකොට මේක සභා සම්මත වුණා කියලා හැමදාම වතුර බවුසර් ඉල්ලන්නේ නෑ. ඊට පස්සේ එදා දවසේ ප්‍රමුඛතාවය අනුව මුලින් ඉල්ලපු කෙනාට බවුසරය යවන්න.

මන්ත්‍රීවරයා ඉල්ලුවම බවුසර් දෙක නැත්නම් එදාට යවන්න බෑ. අපි මේ නොදන්න තොත්ත බබාලා වගේ යෝජනාවක් ගෙනාවේ නෑ. පුළුවන් නම් කරන්න මේ යෝජනාව කරේ. රටේ නැති අප්‍රබංශ විරෝධතා ගෙනැල්ලා වැඩක් නෑ. මන්ත්‍රීවරු එකඟත්වයක් තියෙනවා නම් ඒකට පහසුකම් දීලා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි මන්ත්‍රීතුමා, මේකේ ක්‍රමවේදයක් තියෙනවා. පළවෙනි එක තේරුම් ගන්න ඕන මේකේ ගෙනියන්න බැරි තැන් 25%ක් තියෙනවා. වතුර බවුසරය ගෙනියන්න බැරි තැන් තියෙනවා. ඔබතුමාලා දුරකථනයෙන් මෙහෙට කියලා වතුර බවුසරය එවන්න කියලා මෙහේ නිලධාරීන්ගේ ඔලුව කනවා වතුර බවුසරය යවන්න බැරි වුණොත්. මේකට තැන බලලා, ඔක්කොම කරලා තමයි දෙන්න ඕන. ණයට දෙන ක්‍රමවේදයක් හදන්නේ කොහොමද?. මම කියන්නේ ණයට දෙන ක්‍රමවේදයක්, අපේ සුභ සාධක සමිතියෙන් ණය අරගෙන ණය නොගෙවපු අය ඉන්නකොට, අපිට සුභ සාධක සංගමයක් තියා ගන්න බැරිව ඉන්නකොට තව මොනවද කතා කරන්න තියෙන්නේ. ණය තියෙන අයව ප්‍රසිද්ධ කරන්න කියලා මම කියලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක අද නෙමෙයි කියන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** දැන් ඔබතුමා කියපු කාරණාව එකක්. දැන් ඔබතුමා කිව්වා සුභ සාධක සමිතියෙන් මුදල් අරගෙන පැහැර හැරපු පිරිස නිසා මේක බෑ කියලා. හැබැයි මේක ඊට එහා ගිහිල්ලා නීතිගත කරලා තියෙන්නේ. මේක සම්මත වුණාම මෙහෙන් ගෙවන ඕනම දීමනාවකින් අය කරන්න කියලා යෝජනාව සම්මත කරන්නේ. සුභ සාධක මුදල වෙනයි මේක වෙනයි. එතනින් එහා මම කතා කරන්නේ නෑ. න්‍යාය පත්‍රයේ ඊළඟ මගේ යෝජනාවට යනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මමත් දන්නේ නෑ ඇත්තටම සුභ සාධක සංගමයට මමත් යම්කිසි මුදලක් දෙන්න ඕන බව. මාව දැනුවත් කරේ ලේකම්තුමා දින කීපයකට කලින්. ඇත්තටම අපි දන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක නිදහසට කාරණයක් නෙමෙයි මන්ත්‍රීතුමා. තමන් ණයක් ගත්තා නම් තමන් දන්නවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සුභ සාධක සංගමයෙන් පොඩි ණය ප්‍රමාණයක් ගන්න පුළුවන්. ඒක ගත්තම දීමනාවෙන් කැපෙනවා. හැම මාසෙම දීමනාවෙන් කපලා තමයි අපිට ඉතුරු මුදල දුන්නේ. අන්තිම මොහොතේ සභාව විසුරුවනකොට වැඩිපුර මුදලක් තියෙනවා නම් ඒක කපා ගන්නවා. නමුත් එහෙම කපා ගත්තද නැද්ද කියලා දන්නේ නෑ. අපිව දැනුවත් කරන්නේ නෑ. අපිට ගෙවන්න තියෙනවා කියලා කිව්වේ නෑ. අපිට අන්තිම වෙනකම් කිව්වේ නෑ. මේ ඊයේ පෙරේදා ලේකම්තුමා කිව්වම තමයි දන්නේ. ඒ හේතුව උඩ තමයි සුභ සාධක සංගමයෙන් මන්ත්‍රීවරුන්ව අයින් කරලා තියෙන්නේ. එහෙම නම් මුලින්ම කරන්න ඕන අර මන්ත්‍රීවරුන්ව දැනුවත් කරන්න ඕන ඔබතුමාගෙන් මෙන්න මෙච්චර මුදලක් ගෙවන්න තියෙනවා. ඒක ගෙවන්න කියලා. එහෙම නම් අපි ගෙවන්නේ නැතුව ඉන්නේ නෑනේ. ඊයේ පෙරේදා පර්මිට් දාලා පොඩි මුදලක් ගෙවන්න තිබුණා. මම ඊළඟ දවසේ ඇවිත් ඒක ගෙව්වා. රුපියල් දෙදහස් පන්සියයක්. අපි මන්ත්‍රීවරු විදියට ගරුත්වයක් තියෙන මන්ත්‍රීවරු. ඔබතුමන්ලාවත්, නිලධාරීන්වත් හිතන්න එපා අපි පොලු තියන මන්ත්‍රීවරු කියලා. එහෙම පොලුකාරයෝ කියලද හිතන් ඉන්නේ. මේ හිතන් ඉන්නේ පොලු තියන මන්ත්‍රීවරු නිසා ෂුවර් නෑ කියලා. මන්ත්‍රීවරු හැල්ලුවට පත්කරලා තියෙන්නේ මෙහේ. එක්කෝ කියන්න ඕන අපි දෙනවා. ඉවරයිනේ. දෙන්නේ නැතුව ඉන්නේ නෑනේ. අපි මිනිස්සු ඉස්සරහ මේ තරම් මුදලක් ගෙවන්න තියෙනවා කියලා කියනවට කැමති නෑ කවුරුවත්. අපි දැනුවත් කරන්න. ලිඛිතව දෙන්න මේ මුදල දෙන්න තියෙනවා ඒක දෙන්න කියලා. අපි කාර්යබහුල මිනිස්සු. අපි ඕවා හොය හොය ඉන්නේ නෑ දීමනාවෙන් කැපෙන නිසා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කිව්වේ ඒක නෙමෙයි මන්ත්‍රීතුමා. උදාහරණයක් ගිය සභාවේ ඉඳලා ණය අරගෙන මන්ත්‍රීවරු නොගෙව්වොත් මොකද වෙන්නේ. මම නිකන් උදාහරණයක් අහන්නේ. එතකොට ඒ ණය ගෙවන්නේ කවුද?

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එකේ වැරැද්ද කාගේද?, සභාවක් විසුරුවනකොට දින වකවානුවක් තියෙනවා. මට දින වකවානුවක් තියෙනවා නම් ඒ ගනිපු අයගේ අන්තිම සභාවේ දීමනාවෙන් සම්පූර්ණ මුදල කපා ගන්න පුළුවන්නේ. ඒක ඇයි කරන්න බැරි. ඒ ඇයි කරේ නැත්තේ ඒක. එක පාරටම සභාව විසුරුවලා දාන්නේ නෑනේ. සභාව විසුරුවනවා කියලා දැනුවත් කරා. ඊට කලින් අයකරගන්න දැන ගන්න එපැයි සුභ සාධක සමිතියෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වුණාට පහුගිය අන්තිම සභාව විසිරෙව්වේ එකපාරටම.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එකපාරටම විසිරෙවුවේ නෑ. දැනුවත් කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනුවත් කරේ නෑ. මැයි 13 කිවුවේ 15 වෙනිදාට විසුරුවනවා කියලා. ඩෝං ගාලා විසුරුවෙව්වා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මාස 06ක් දීර්ඝ කරා. මන්ත්‍රීවරු හිතන් හිටියා තවත් දීර්ඝ කරයි කියලා. නමුත් දීර්ඝ කරේ නෑ. විසුරෙව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ අනවශ්‍ය තැනකට යන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** කට්ටිය බලාගෙන හිටියා ඡන්දේ තියන්නේ නැති නිසා කාලය තව දික්කරයි කියලා. ඒකෙදී නිලධාරීයාට තිබුණේ කාලය දික්කරන එක බලන් ඉන්නේ නැතුව ඉවරවෙන කාලය බලලා ණය මුදල් ටික කපාගෙන ඉතුරු මුදල් ලබා දෙන්න. ඒක කරන්නේ නැතුව තව කාලය දික්කරයි කියලා බලන් ඉඳපු එක වැරදියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි අදාළ මාතෘකාවට යමු. එකම දෙයයි අපි පළාත් පාලන කොමසාරිස්ගෙන් පුළුවන්ද කියලා අහමු. සභාවේ මෙතෙක් කිසිම දෙයක් ණයට දීලා නෑ. කිසිම දෙයක් ණයට දෙන්න ක්‍රමවේදයක් සභාවට නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නිකං දීලා තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නිකං දීලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇත්තටම තම තමන්ගේ දේවල් වලට නිකං දෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද?

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පන්සල් පල්ලි වලට නිකං දෙනවානේ. ඉතිං ඒක තමයි කියන්නේ. තමුන්නාන්සේලා ඒකට දෙන ක්‍රමවේදයක් හදලා තියෙනවාද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒවා සේවාවක්නේ. ඔබතුමා කියන්නේ ඒකත් එපා කියලද, මට වැඩිය ලේසියි. ඒවා නවත්වමු.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒවා නවත්වන්න එපා. ඒවා ක්‍රියාත්මක වෙන්න එපැයි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි කලින් බවුසරයක් ඉල්ලුවා. නමුත් අපිට හම්බවුණේ නෑ. අපිට මේ ප්‍රශ්නය තියෙන නිසා කතා කරන්නේ. ලබුදූවට එකක් ගියා. අනික උක්වත්තට ගියා. මම අතින් සල්ලි දීලා වතුර බවුසරයක් අරන් දුන්නේ අවශ්‍යතාවයට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බවුසර් දෙකයි තියෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක තමයි මෙතුමාගේ යෝජනාවට සහාය පල කරලා කතා කරේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා ඔබතුමා, ඔබතුමා ඉල්ලන්න කලින් වෙන්න ඇති ඒ මන්ත්‍රීවරු ඉල්ලන්න ඇත්තේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඊට කලින් ඉල්ලුවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒක ප්‍රශ්නයක් ඉතිං.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද?

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක වැරදියිනේ ඉතිං.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා කලින් ඉල්ලලා තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. මාසෙකට කලින් තුසිත මන්ත්‍රීතුමයි, ගයාත්‍රී මන්ත්‍රීතුමියයි ඉල්ලලා තිබුණේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එහෙම දෙයක් සිදුවෙලා තියෙනවා නම් හරිනේ ඉතිං.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි ඒකේ ලියකියවිලි ටික පොඩ්ඩක් පරීක්ෂා කරලා බලමුද?

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපේ ප්‍රියන්ත මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ගත්තම ඇත්තටම මම පක්ෂයි. මොකද හේතුව අපි ඇමතුමක් ලබාදීලා හදිසි මළගෙයක්, දානගෙයක් වුණා කිව්වම ඒ දේ කරලා දෙන්න ඕන. නමුත් ඒකේ නීතිමය පැත්ත හෙයලා බලලා ක්‍රියාත්මක කරන්න. ඒ යෝජනාව ඉතාම හොඳ යෝජනාවක්. මොන යෝජනාව සම්මතකරත් ඔබතුමා තමයි වගකියන්න ඕන සභාපතිවරයා හැටියට. ඒ ගැලපීමත් ඔබතුමා සකස්කරගෙන පළාත් පාලන කොමසාරිස්ගෙන් අවසර අරගෙන ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි කිව්වේ කොමසාරිස්තුමාගෙන් අවසර ගන්න ඕන. මේක දැන් සභාවේ ස්ථිර කරානේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඊළඟ යෝජනාව තමයි සභාපතිතුමනි, ඔබතුමා කිව්වා නේද සුභ සාධක සමිතියෙන් අපි ඉවත් කරලා තියෙනවා කියන එක. ඇත්තටම එකෙන් මන්ත්‍රීවරු ණයක් අරගෙන තියෙනවලු. ඒක ගෙවලා නැලු. හැබැයි ගරු සභාපතිතුමනි ඔබතුමාත් මේ සභාවට එහෙම කියපු එක වැරදියි. ආත්මගරුත්වයක් තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම නම් කියන්නම් ඕන නම්. නම් තියෙනවා. අබේසේකර මන්ත්‍රීතුමයි, කියාස් මන්ත්‍රීතුමයි, අමිල නුවන් මන්ත්‍රීතුමයි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** නම් තියෙනවා නම් ඒ කට්ටියට කලින් දැනුම් දෙන්න එපැයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනුම් දෙන්න ඕන ඒක හරි. ඒක මම පිළිගන්නවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඇයි ඒක සභාවට කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මම පිළිගන්නවා. දැනුම් දෙන්න ඕන.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඇයි දැනුම් දුන්නේ නැත්තේ ?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම දෙයක් තියෙන්නේ. මගේ කාලයේ සිද්ධ වෙච්ච දෙයක් නෙමෙයි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මේ කරපු වැරැද්ද ගරු සභාවට කියන්න ඉස්සෙල්ලා ලේකම්තුමාට යුතුකමක් තියෙනවා කතා කරලා මන්ත්‍රීවරුන්ව දැනුවත් කරන්න. සභාපතිතුමාව දැනුවත්කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං මෙතුමා කිව්වේ ලේකම් කිව්වා කියලනේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගිය සතියේ කිව්වේ. මමම ඇහුවේ ලේකම්තුමාගෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** උප සභාපතිතුමා මම ඉන්න මතය මෙච්චරයි. මෙහෙම දෙයක් තියෙන්නේ. ඔබතුමා මේ මොනවා කිව්වත් උප සභාපතිතුමා, මෙතුමන්ලා මන්ත්‍රීවරුන්ට තියෙන ගෞරවය හින්දා, ඕක කියන්න ගියාමත් ප්‍රශ්නයක් වෙන හින්දා නොකියා ඉන්න ඇති. නමුත් අවංකවම මන්ත්‍රීතුමා, තමන් ණයක් ගත්තා නම් තමන්ගේ හෘද සාක්ෂිය දන්නවා

තමන් ණයක් ගත්තා කියලා. ඇත්ත කතාව ඒක. හැබැයි දැනුම් දෙන්න ඕන. අනිත් බැංකු වගේ නෙමෙයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම කියන්නේ මෙහෙමයි සභාපතිතුමා, ණයක් ගන්න ක්‍රමයක් තියෙනවා. ඒ ක්‍රමයට යන්නේ නැතුව නිකන් අන්තිම මොහොතේ සභාවේ මන්ත්‍රීවරු සල්ලි ගෙව්වේ නෑ කියලා හරියන්නේ නෑ. එහෙම නම් ඒ මන්ත්‍රීවරු මන්ත්‍රී නොවුණත්, මන්ත්‍රී ධූරයට පත් නොවුණත් යම් මුදලක් ගෙවන්න තියෙනවා නම් ඒක ගැන දැනුවත් කරා නම් අපි ගෙවනවා. ගෙවන්නේ නැත්නම් ගන්න ක්‍රමත් තියෙනවා. එහෙම නොකර මෙහෙම කතා කරන්න එපා. මම යෝජනාවක් විදියට ගේනවා ඊළඟ සභා වාරයේ ඉඳලා මමයි, අබේසේකර මන්ත්‍රීතුමයි ගෙවන්න තියෙන සල්ලි කපා ගන්න ඕන. ලබන මාසේ ඉඳන් කපන්න වහාම. අපි යෝජනාවක් විදියට ගේනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලියුමක් දෙන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක අල්ලගෙන තමයි සුභ සාධක සංගමයෙන් සියලුම මන්ත්‍රීවරුන්ව අයින් කරේ. වෙනදා මන්ත්‍රීවරයෙක්ගේ ගෙදරක මළගෙයක් වුණාම සුභ සාධක සංගමයෙන් යම්කිසි මුදලක් ලබා දෙනවා. දැන් මේ සැරේ කිසිම මන්ත්‍රීවරයෙක්ගෙන් මුදලක් අයකරගෙනත් නෑ. අපි මේවාට කියනවා නෙමෙයි. නිලධාරීන් චාරිකාවක් යනවා නම්, ඕනම දේකට අපි සභාවෙන් ලක්ෂ ගණන් මුදල් අනුමත කරලා දෙනවා. ඉල්ලපු ගමන් දෙනවා. නමුත් අපිට මෙහෙම කරනවා නම්, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකුට මළගෙයක් වුණාම මුදලක් ගෙවන්න බැරි ඇයි සුභ සාධක සමිතියට. සුභ සාධක සමිතියට මන්ත්‍රීවරුන් බඳවා ගන්න බැරි ඇයි.?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම දෙයක් තියෙන්නේ මන්ත්‍රීතුමා ඇත්තම කතාව. මමත් ඒ සුභ සාධක සංගමයේ හිටියා. එක රුපියලක් මම ණයක් අරගෙනත් නෑ. ගෙවන්නත් නෑ. නමුත් තමන්ට යුතුකමක් හා වගකීමක් තියෙනවා. තමන් ණයක් ගත්තා නම් මන්ත්‍රී ධූරයෙන් අයින් වෙනකොට හරි අහලා තමන් කීයක් අරගෙනද කියලා ගෙවන්න. නීති ද, ලියුම් එවුවද, කිව්වද කියලා කොන් අල්ලගන්න එක නෙමෙයි. තමන්ගේ හෘද සාක්ෂියට යුතුකමක් තියෙනවා තමන් ධූරයෙන් යද්දි ගෙවන්න. එහෙම නම් මම රජයේ රැකියාවෙන් අයින් වෙනකොට බයිසිකලේ සල්ලිත් ගෙවලා, රජයට ගෙවිය යුතු සියල දේ ගෙවලා තමයි මම අයින් වුණේ. මම ගනිපු ණය, රජයෙන් හම්බවුණ බයිසිකලේට රු.50,000.00ට අමතරව තව රුපියල් රු.149,000.00ක ඒ සියලු දේ ගෙවලා තමයි මම අයින් වුණේ. ඕන කෙනෙක්ගේ යුතුකමක් හා වගකීමක් ඒක.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** යම් කිසි මුදලක් ගෙවන්න තියෙනවා නම් අදාළ මන්ත්‍රීවරයාට දැනුවත් කරලා තිබුණා නම් ගෙවනවා. දැනුවත් කරාද මෙහෙන්.? අපි පෝසත් මන්ත්‍රීවරු නෙමෙයි. අපිට සල්ලි හදිස්සියක් වුණාම සුභ සාධක සංගමයෙන් සල්ලි ගන්නවා. ගත්තට පස්සේ ගත්ත දිනේවත් මතක නෑ. දීමනාවෙන් කැපෙනවා. ඒක ගෙවිලා ඉවර වුණාම ආයේ දෙන්නේ. අපිට මතක නෑ අපි කොච්චර ගෙවන්න තියෙනවද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනුවත් නොකිරීමේ වරදක් තියෙනවා. මම කියන්නම්. විජේපාල මහත්මයානේ මේක කරන්නේ. විජේපාල මහත්තයා ඔබතුමාට කීප පාරක් කිව්වා කියලා කියනවා. නමුත් වැරැද්දක් තියෙනවා. ඕන එකක් කාටවත් කිව්වා නම් ඒක නැහැයි කියන්න පුළුවන්. ලිඛිතව නොදීමේ වරදක් තියෙනවා. ඕක ඇති දැන්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** කිවුවේ නෑ. දැන් ගෙන්වන්න. වහාම ගෙන්වන්න. චෝදනා කරන්න එපා. රු.10,000.00 දෙන්නේ. ලක්ෂ ගණන් දෙන්නේ නෑ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** සභාවට ඒක කියපු එක වැරැදියි. දැනුවත් කිරීම කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඒක සුභ සාධක සංගමය ඇතුළේ විසඳ ගන්න. සභාව කරගෙන යන්න. වැඩිහිටි මන්ත්‍රීවරු විදියට හෘද සාක්ෂියට එකගව වැඩ කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔයා වැඩිහිටියානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ සම්බන්ධව ඇති. දැන් මෙතුමාගේ යෝජනාව ස්ථිර වුණානේ. ඔබතුමාගේ විරෝධතාවය අපි අයින් කරගමු. බෙදීමකට යන්න ඕන නෑ. ඕක පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යවනවානේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මගේ විරෝධතාවය පැහැදිලිව සඳහන් වෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** විරෝධතාවය සටහන් කරනවා නම් බෙදීමකට යන්න ඕන.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මම විරුද්ධ වෙන කාරණා දෙකයි තියෙන්නේ. එකක් දුරකථන ඇමතුමකින් මේ ඉල්ලීම කිරීම නිසා මේ වේලාවේදී ගැටළු පැන නගිනවා. අනිත් එක මන්ත්‍රීවරයා විසින් රු.1,000.00ක දඩයක් ගෙවිය යුතුයි කියන එක. ඒ නිසා මගේ විරෝධතාවය සටහන් කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔන්න බළලා මල්ලෙන් එළියට පැන්නා. මේකයි සභාපතිතුමා, විරෝධතාවක් තියෙන තැන යෝජනාවක් සම්මත වෙන්නේ නෑ මම දන්න මට්ටමින්. ඒ නිසා බෙදීමකට යන්න ඕන. දඬේ කතාව තමයි මෙතන තියෙන ලොකු විරෝධතාවය. මම අවංක නම්, අවංක මහජන සේවයක් කරනවා නම් දඬේ රු.1,000.00ක් නෙමෙයි රු.10,000.00ක් දීලා හරි සමාජ සේවය කරන්න ඕන මන්ත්‍රීතුමා. මේකේ දඩ ගහන්න ඕන නෑ මන්ත්‍රීවරයා නියමිත වගකීම ගන්නවා නම්. මේ යෝජනාවේ වඩා වැදගත් ඒක. ඔබතුමා වගකීමක් ගන්න බැරි, කොන්දක් පන නැති සමාජ සේවකයෙක් විදියට අපි දකිනවා. බෙදීමකට යන්න. මම බෙදීමක් ඉල්ලනවා. මේක තමයි අවංක දේශපාලඥයෙකුගේ යුතුකම. මේකට බයවෙන්න ඕන නෑ. සභාපතිතුමාවත් බය වෙන්න එපා. බෙදීමක් ඕන. බෙදීමකට යන්න. ඊළඟ ටික ඉදිරිපත් කරන්න බෙදීමකට යන්න.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** දඩයක් ගහන්නේ වැරැද්දක් කරාම. ඒ මන්ත්‍රීවරයා ඉල්ලන වතුර බවුසරය ලබා දීලා, එයා ගෙවීම් කරන්න පරක්කු වුණා කියලා දඩයක් ගහන එක වැරදියි. එතකොට මන්ත්‍රීවරයාගේ ගරුත්වය මොකක්ද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බෙදීමකට යන්න ඕන නෑ. මෙතුමා කියන්නේ කාරණා දෙකක් පිළිබඳව මෙතුමා එකඟ නෑ කියලා. එතුමාගේ විරෝධතාවය ඒක. මේක දැන් ස්ථිර වෙලා තියෙනවා. එතුමා කියන්නේ දුරකථනයෙන් දැනුම්දෙන එකටයි, දඬේටයි එතුමා එකඟ නෑ කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** බෙදීමකට යන්න. මේකට බෙදීමක් ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමාට බෑ. විරෝධතාකරු ඉල්ලන්න ඕන. චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමා මේක ගැන පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් අහනවා. අහලා තමයි මේක කරනවා නම් කරන්නේ. නැත්නම් නෑ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එහෙම නම් යෝජනාව කල් තියලා පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් අහලා කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** කල් තියන්නේ නෑ. කල් තියන්න අවශ්‍ය නෑ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මේ වචන දෙක ඉවත් වෙනවා නම්, දුරකථනයෙන් දැනුම් දෙන එකයි, දඩයක් කියන එකයි. සංශෝධනය කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඉවත් කරන්නේ නෑ මම. ඉවත් කරොත් මේකේ වගකීමක් නෑ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමා, තමන්ගේ කොට්ඨාසය තුළ දුරකථනයෙන් ඇමතුමක් ලබා දුන්විට මේ කාර්යය කරන්න පුළුවන් නම් මන්ත්‍රීවරයෙක්ට ලැබෙන ගෞරවයක් ඒක. මේක කළ යුතු වැඩක්. කළ හැකි දෙයක්. ඒක නොකළ හැකි දෙයක් නෙමෙයි මන්ත්‍රීතුමා. කාලෝචිත දෙයක් මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන අඩුපාඩුවක් තියෙනවා. මොකද දන්නවද, කියපුවත් නැහැයි කියන කාලේ මේ. ලිඛිතව දෙන්න ඕන. ෂෝක් කතාවක් මේ කියන්නේ. ඒකට මම එකඟ නෑ නිශ්ශබ්දව හිටියට. කොමසාරිස්තුමාගෙන් උපදෙස් අරගෙන කොහොමත් මම මේක

කරන්නේ. හේතුව මම කියන්නම්. ලිඛිතව නැතුව කොහොමද මන්ත්‍රීවරයෙක්ගෙන් අය කරගන්න විදිය මට කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අය කරන ක්‍රමවේදය මේකේ තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දුරකථනයෙන් දැනුම් දීලා, මම ඉල්ලුවේ නෑ කිව්වොත් අන්තිමට. දුරකථන ඇමතුම් මන්ත්‍රීවරු දෙන්න ගියොත් මට වෙන වැඩක් කරන්න හම්බවෙන්නේ නෑ. චුට්ටක් ඉන්න කියන්න. ඒක නෙමෙයි මම කියන්නේ. කියන එක අහන්න. කියන සිංහල තේරුම්ගන්න. ණයට දෙන්නත් ඕන. මන්ත්‍රීවරු කියන්න මේ කතාව ප්‍රායෝගිකද කියලා. දුරකථනයෙන් දැනුම් දෙන්නේ. අය කරනකොට දඩයකුත් ගහනවා. ප්‍රායෝගිකද ?

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මේකයි සභාපතිතුමා, අයකර ගැනීමේ ක්‍රමය මේකේ තියෙනවා. ඒකත් එක්කයි මේක සම්මත වෙන්නේ. ඔබතුමා මේක කියවලා බැලුවේ නැද්ද. මේකේ අයකරගන්න ක්‍රමය තියෙනවා. දඩයකුත් ගහන්න ඕන ඒ මදිවට. ඔබතුමා කියන තරම් බොළඳ විදියට නෑ. අපි දුරකථන අංක දීලා තියෙනවා පෞද්ගලික නමට ලියාපදිංචිවුණ. ඒවාගෙන් දුරකථන ඇමතුමක් ආවාම එයා නෙමෙයි, මෙයා නෙමෙයි කියන්න බෑ. ඒවාට නිලධාරීන් නිකම් දෙන්නේ නෑ. සහතික වශයෙන් ගත්තට පස්සෙයි බවුසරයක් යවන්න ඕන. අය කරන ක්‍රමවේදය මේකේ තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ණයට දෙන එක ගැනත් අපි දැන් අරගෙන් විමසන්න ඕන. එහෙම තියෙද්දී මේ දුරකථන ඇමතුමට යන එක ප්‍රායෝගික නෑ මන්ත්‍රීතුමා. ඔබතුමාලාගේ හිත හදන්න මට මේක නෑ කියන්න පුළුවන්. ඔබතුමා කියන්න හෘද සාක්ෂියට එකඟව කවුද ඒ වගකීම ගන්නේ. කොහෙද ඒක නීත්‍යානුකූල.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒක නීත්‍යානුකූලයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ණයට දීමක් දුරකථනයෙන් දැනුම්දීලා නීත්‍යානුකූලයි? කෝල් එකක් දීලා මුදල් දෙන්න පුළුවන්ද?

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මන්ත්‍රීවරුන්ව අවිශ්වාස කරන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විශ්වාස නැති ප්‍රශ්නයක් නෙමෙයි තියෙන්නේ. ඔබතුමා රජයේ නිලධාරියෙක්නේ. දුරකථනයෙන් දැනුම්දීලා ණයට ගන්න පුළුවන්ද?

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** හේතු වැඩක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට කියන්න ඕන වුණේ සංශෝධනයක් මන්ත්‍රීතුමා. ඒ මනුස්සයොන්ට එන්න බැරිනම්, මන්ත්‍රීවරයා ඇවිත් ලියුමකින් මේක සහතික කර ගන්න බැරි ඇයි? මම අහන්නේ එක දෙයයි. ඒ ගෙදර මනුස්සයට එන්න බැරිවෙන්න පුළුවන්. මම කතා කරන්නේ මේක කෙරෙන තැනට. ගෙදර මනුස්සයට එන්න බැරිවෙන්න පුළුවන්. ඇයි මන්ත්‍රීවරයාට ලියුමක් අරන් ඇවිල්ලා මෙතනට දෙන්න බැරි. ඒ ලියුමට තමයි තිකුත් කරන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ මන්ත්‍රීවරයා ලියුමක් අරන් එන්න බැරි තරම් දුරක ඉන්නවා නම්?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට තේරෙන්නේ නෑ කොහොමද නිකම්ම නිකම් දුරකථන ඇමතුමක් දීලා වතුර බවුසරය යවන්නේ. සල්ලිත් නෑ. මුකුත් නෑ. ශත පනහක් ණයට දෙන්න පුළුවන් ක්‍රමවේදයක් මට කියන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභා යෝජනාවක් තියෙනවා. ඒ යෝජනාව සම්මත වුණාට පස්සේ ඔබතුමාට පුළුවන් මුදල් රෙගුලාසිවලට පටහැනිභාවයක් තියෙනවා නම් ඒක තහවුරු කර ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතින් පටහැනිභාවයක් තියෙනවානේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දුරකථන ඇමතුමක් නීත්‍යානුකූල කරගන්න පුළුවන්. ඒක නීතියට වලංගුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ටෙලිග්‍රෑම් පුළුවන්. මම අද නිවාඩුයි කියලා ආයතන ප්‍රධානියාට දුරකථන ඇමතුමකින් දැනුම් දීලා ඊට පස්සේ ඇවිත් වෙනම ෆෝම් එකක් දාලා ඒක සහතික කර ගන්න පුළුවන්. ඒ නිවාඩු වලට. මේක ණයක් දීමක් කරන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මේ ප්‍රශ්නය ඇඳුණ නිසා මම කතා කරන්නේ. ඇසළ පෝය දවසේ මම ජල බවුසරයක් ඉල්ලුවා. ලිඛිතව ඉල්ලලා තියෙනවා. ඒ ලිපිගොනුව ගෙනත් පෙන්වන්න මීට කලින් ලිඛිතව දැනුම් දීලා තියේද කියලා. කාරක සභාවක් කරලා මේ ලිපිගොනුව ගෙන්වන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඔබතුමා ඉල්ලන්න. දැන් මෙහෙට ගේන්න බෑ. ඊළඟ මහා සභාවට ගේන්නම්. ඔබතුමාලා ඉල්ලන ඉල්ලන එකට මේ විනාඩියෙන් දෙන්න මම බැඳිලා නෑ. ලබන මාසයේ සභාවට ඉදිරිපත් කරන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කාරක සභාවක් යෝජනා කරනවා. ඔබතුමා මන්ත්‍රීවරුන්ව හැල්ලුවට ලක්කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලබන මාසේ සභාවට ඉදිරිපත් කරන්නම්. දැන් බෑ. එහෙම නම් ඕක මට කලින් දීලා තියෙන්න ඕන. ඔබතුමා දැන් කිවුවොත් මම තව දේවල් ගෙන්වන්නද?

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** වෙනදත් ගෙන්වනවා ලිපිගොනු.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** කලින් ඉල්ලුවම ලිපිලේඛන හදන්න පුළුවන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සේපාලිකා මිස් ගාව තියෙන්නේ බවුසර් යවපුවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** වෙනදත් ගෙන්නුවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගෙන්වලා බලන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක බලන්න ඕන ලියුම් දීපුවා. ගියපු විදිය. නිකුත් කරපුවා බලන්න ඕන. හරි රයිට් සුගත් මන්ත්‍රීතුමා එහෙම කරමු. මම ගෙන්වන්නම් ලබන මාසේ. මම ගේන්නේ ලබන මාසේ සභාවට. ඔයගොල්ලෝ අද දුන්නොත් ලිඛිතව මම ලබන සභාවට දෙන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාවේ මන්ත්‍රීවරයෙකුට කාරක සභාවක් කරලා ඉල්ලන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊළඟ සභාවට දෙන්නම්. ලිඛිතව ඉල්ලන්න. මේ න්‍යාය පත්‍රයේ එහෙම එකක් අහලා නෑ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි කාරක සභාවක් කරලා ඉල්ලන්නේ. අපි යෝජනා කරනවා කාරක සභාවක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. ඔබතුමාලා ඉල්ලන්න. ලබන සභාවේදී දෙන්නම්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** රහස මොකක්ද ඒකේ?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කිසි රහසක් නෑ. ගෙන්වන්නේ නෑ. ලබන සභාවට ගේන්නේ. න්‍යාය පත්‍රයට යනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගෙන්වන්න බැරි මොකද?

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** තමුන්නාන්සේගේ ඕන එපාකම්වලට වැඩ කරන්න බෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පෞද්ගලික ඒවා නෙමෙයි. දෙන එක හරියට දෙන්න ඕන පිළිවෙලට. ඔහොම ලිපිගොනු හදලා නෑ මන්ත්‍රීතුමා. එකින් එකට ලිපිගොනු හදන්න

ගිහින් බෑ. ඒ ලියුම් ටික බලලා හදන්නේ. ඔබතුමාලා මට කියන්න ඕන නෑ නිලධාරීන්ව ගෙන්වන්න. න්‍යාය පත්‍රයට යනවද නැද්ද, න්‍යාය පත්‍රයට නොගියොත් සභාව කල් තියනවා. නිශ්ශබ්ද වෙන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඕන තරම් ලිපිගොනු සභාවට ගෙන්වලා තියෙනවා. ඇයි ගෙන්වන්න බැරි?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඔබතුමාලා දෙන්න. මම ඊලඟ සභාවට ගෙන්වන්නම්. ඒ නැත්නම් කරන්න දෙයක් නෑ. න්‍යාය පත්‍රයේ එහෙම දෙයක් නෑ. න්‍යාය පත්‍රයේ තියෙන දේ තමයි සභාවේ කෙරෙන්නේ. සභාවේ කෙරෙන්නේ ඒක. න්‍යාය පත්‍රයේ තියෙන දේ බැරි නම් මම සභාව කල් තියනවා. සභාව විනාඩි 15කට කල් තබනවා.

**(සභාව විනාඩි 15කට කල් තබන ලදි.)**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවේ වැඩ කටයුතු ආරම්භ කරමු. ප්‍රියන්ත මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර වුණා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඉතුරු ටික ඉදිරිපත් කරේ නැනේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාපතිතුමා කාරක සභාවක් යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. මොකක් සඳහාද ? න්‍යාය පත්‍රයට අනුව සභාව යන්නේ. දැන් ඔබතුමාට කතා කරන්න අවශ්‍යතාවයක් නෑ. න්‍යාය පත්‍රයට අනුව කතා කරන්නේ අර මන්ත්‍රීවරයා. ඔබතුමා කතා කරන්න එතුමාගේ යෝජනා ගැන. අවස්ථාව තියෙන්නේ යෝජනා ගැන කතා කරන්න. න්‍යාය පත්‍රයට අනුව යෝජනා ගැන කතා කරන්න. මන්ත්‍රීවරයාට කතා කරන්න අවස්ථාව තියෙනවා න්‍යාය පත්‍රයට අනුව යෝජනා ගැන කතා කරන්න. එහෙම නැතුව කරන්න බැනේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපි මතු කරන්නේ පොඩි ප්‍රශ්නයක්. ඔබතුමා මේ සුළු ප්‍රශ්නයටත් මේ විදියට හැසිරෙනවා නම් අපිට සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් කිසිම සැලකීමක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම කතා කරලා න්‍යාය පත්‍රයට පිට වැඩ කරන්න බෑ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සේපාලිකා මිස්ව ගෙන්වලා අහන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** න්‍යාය පත්‍රයට පිට බෑ. කොහොමත් මින් ඉදිරියට න්‍යායපත්‍රානුකූලව විතරයි වැඩ කරන්න පුළුවන්. මම ඒකට අවස්ථාවල් දීලා අන්තිමට මම මේක මෙහෙයවන්නේ බැරි කෙනෙක් බවට පත්වෙනවා. මම තමයි නිකන් හරි මන්ත්‍රීවරුන්ට කතා කරන්න අවස්ථාව ලබාදීලා යන්නේ. මින් ඉදිරියට න්‍යාය පත්‍රයට අනුව යන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කාරක සභාවක් කැඳවන්න පුළුවන් කොයි අවස්ථාවටද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාපතිවරයාට පුළුවන්. ඕන පනතකින් පෙන්වන්න. මන්ත්‍රීවරුන්ට පුළුවන් එතුමාලාගේ අත්සනින් ගෙනැල්ලා විශේෂ සභාවක් කැඳවන්න විතරයි. කාරක සභාවක් මම දෙන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා බලහත්කාරයෙන් යන්න එපා. සභාවේ බහුතරයක් මන්ත්‍රීවරු ඉල්ලනවා. මෙතන ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද?

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ කාරණය සම්බන්ධව පැහැදිලිව ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොන කාරණය සම්බන්ධවද?

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ජල බවුසර් සම්බන්ධයෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ජල බවුසර් මතුවුණේ මේ කාරණය සම්බන්ධව. ඒ සම්බන්ධ කාරණා තියේ නම් කතා කරන්න. ප්‍රශ්න කතා කරන්න. මේ යෝජනා සම්බන්ධව ප්‍රශ්නයක් තියේ නම් අපි කතා කරමු. වාද කරමු. එතනින් එහාට වෙන දේවල් බෑ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔව්. ඒ යෝජනාව සම්බන්ධව තමයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට අවශ්‍ය දෙයක් තියේ නම් ඉල්ලන්න. ලබන සභාවේදී දෙන්නම්. ඉල්ලීම කරන්න ලබන සභාවේදී දෙන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා එවැනි බලහත්කාරකම් කරමින් සභාව ගෙනියන්න උත්සහ කරන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමාගේ විරෝධතාව එතුමා ඉල්ලා අස්කර ගනිවී. පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් මේ ගැන විමසනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභා වාර්තාවට ඇතුලත් වෙන්න ඕන ඒක. එතුමා ඉල්ලා අස්කර ගන්න එක. ගරු සභාපතිතුමා, මේ සභාවේ ගරු මන්ත්‍රීවරයෙක් න්‍යායපත්‍රානුකූලව තමන්ගේ යෝජනාව ඉදිරිපත් කරාම මතුවෙච්ච ප්‍රශ්නයක් නිසා ඒ ප්‍රශ්නය නිරවුල් කර ගන්න සභාවේ ලේඛනයක් සම්බන්ධ නම් ඒක ඉදිරිපත් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මේ යෝජනාව සම්බන්ධයෙන් මතුවෙච්ච ප්‍රශ්න මට කියන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කලබල වෙන්නේ නැතුව ඉන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා වාඩිවෙන්නකෝ. ඔබතුමා යෝජනාව යන්න දෙන්න.

ඒ මන්ත්‍රීතුමා කතා කරයි. මම සභාව ඊලඟ සභාව තෙක් කල් තියනවා. ඊලඟ සභාව තියෙන්නේ සැප්තැම්බර් මාසේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා ප්‍රශ්න වලින් පැනලා යන්න උත්සාහ කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට කතා කරන්න තියෙන අයිතිය මොකක්ද? අර මන්ත්‍රීවරයා කතා කරලා ඉවර වුණාම මම ඕනනම් වෙලාවක් දෙන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ සභාව තමුන්නාන්සේ කෝලම් මඩුවක් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මීළඟ සභාව තියෙන්නේ සැප්තැම්බර් 17 උදේ 09.30ට. මේ ස්ථානයේදී සභාව රැස්වෙනවා. එතෙක් මේ සභාව කල් තියනවා.

**(සභාව කල් තබන ලදි.)**

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.